# සෙනෙහිබර මිත්‍රයෙන



## හිතවත් සෙනෙහෙවන්තය,

ඔබ කිසි දිනක තරු පිරි රැයක අහස දෙස බලා තිබේ ද? හිරු බැස යනු දැක තිබේ ද? ලෝකයේ සෞන්දර්‍ය්‍ය නරඹා විශ්මපත්වී තිබේ ද? මග අසල මලක් අතට ගෙන එහි අලංකාරය හා නිර්මාණය අගය කළේ ද? කඩා හැලෙන දිය ඇල්ලක් දැක, එය නික්මෙන කඳුගැටයේ තේජස දැක, මේ සියල්ල, ඉබේ සෑදුනේ යයි ඔබට සිතිය හැකි ද?



### නිර්මාතාවරයෙකු නැතුව මේ චමත්කාරජනක ලොව ඇතිවුනේ යයි කල්පනා කළ හැකි ද ?

අපේ පෘථුවිය සූර්‍ය්‍යයාගෙන් නියම දුර ප්‍රමාණයක් පිහිටා ඇත. අඟලක්වත් එහා මෙහා වුවහොත් උෂ්ණත්වය වැඩිවී හෝ ශීතල වැඩිවී අප මැරී යනු ඇත. මේ මුළු මැවිල්ලම පැය 24 මුළුල්ලේම අපට මැවුම්කරු සමිඳුන් ගැන ප්‍රකාශ කරයි. ලෝහ කැබලි, මල්ලක දමා සෙලවීමෙන් ඔරලෝසුවක් සෑදුනේ යැයි මා ඔබට කීවොත් ඔබ විශ්වාස කරන්නෙහි ද? නැත. කොහෙත්ම නැත. ඔබ අවට තිබෙන ලෝකය ඉබේම ඇතිවුනේ නැත. නොරැවටෙන්න, මේ විද්‍යානුකූලව ක්‍රියා කරන ඉතා අලංකාර ලොව, නිර්මාතෘවරයෙකු විසින් සාදන ලද බව දක්වයි.



### සත්වයන් පරිණාම වූයේ නැද් ද ?

සත්වයන් දිගු කාලයක් තිස්සේ ක්‍රමයෙන් පරිණාමය වූයේ නම්, මේ පරිණාම අවස්ථාවන්ගෙන් ඉතා ස්වල්පයක්වත් සිදුවී ඇති අනන්ත පරිණාම සංඛ්‍යාවන්ගෙන් සාක්ෂි ලෙස, මේ වන විටත් ඇට සැකිලිවලින් හෝ සොයා ගැනීමට නොහැකි වූවා ද? නිදසුනක් ලෙස, කරමල් වලින් ආශ්වාස කරන සත්ව විශේෂයක්වූ මත්ස්‍යයන්ගෙන්, ගෙම්බන් පරිණාමය වූවානම්, මෙම අතරමැදි පරිණාම අවස්ථාවන්ගෙන් එකම අවස්ථාවක් ගැනවත් හෝ සාක්ෂි පිණිස ඇටසැකිල්ලක් හමුවී තිබේ ද? එකම සාක්ෂියක්වත් හමුවී නැත. නමුත් අප පැහැදිලිව දන්නා සත්‍යයක් නම්, පූර්ව ඓතිහාසික සත්ව ඇටසැකිලි ගැන පවා විද්‍යාව සාක්ෂි දරන බවයි.



## මැවුම්කාර සමිඳුන් බලවේගයක් ද ? නොහොත් වස්තුවක් ද ?

අහසේ පියාසර කරන කුරුල්ලන් දෙස බලන්න. ඔවුන්ට ආහාර සපයන්නේ කවුද? මැවුම්කාර සමිඳුන්ය. එතුමා බලවේගයක් නොව තැනැත්තෙකි. එතුමන්ට පෙර කිසියම් දෙයක් නොතිබිණ. සියල්ල ඇති වූණේ උන්වහන්සේ තුළින් ය. සියල්ල මවන ලද්දේ උන්වහන්සේ විසින් ය. උන්වහන්සේ විසින් නොමවන ලද කිසිම දෙයක් නොවී ය. උන්වහන්සේ මුළු විශ්වයම පවත්වා සිටින සේක.

ඔබ රූපයක් පමණක් නොව ඔබ සිතන පතන, නිර්මාණය කරන්නාවූ තැනැත්තෙකි. ඔබේ යම් ආබාධ තිබුණත්, යම් කොටස් අක්‍රිය වුවත්, 'ඔබ' යනුවෙන් නියම තැනැත්තෙකු සිටියි. මැවුම්කාර සමිඳුන් විසින් ඔබ මවනු ලැබුවේ, අන් මැවිලි වලට හා සතුන්ට වඩා වෙනස් මැවිල්ලක් වශයෙනි. ඔබ දකින සියල්ල ඔබට රස විඳිය හැකිය. ඇතැම් සතුන්ට පාට නොපෙනේ. ඔවුන් දකින්නේ සියල්ලම කළු සුදු ලෙසය. ඔබට නම් සෑම වර්ණයක්ම පෙනේ. ඔබ කන ආහාර පිදුරු මෙන් නොදැනේ. විවිධ රස ඔබට දැනේ. ආාහර වෙනස් රසයන් දැනෙන ලෙස, ඔබේ දිව විවිධාකාරව තනා ඇත. ඔබේ නාසයට සුගන්ධයක් දැනේ. ඔබේ කනට මිහිරි නාද ඇසේ.



## ඔබට දණහිස් හෝ වැලමිට නොතිබුණේ නම්, ඔබ කුමන ආකාරදැයි ඔබට සිතිය හැකි ද ?

ඔබේ සර්වාංගයේ නොයෙක් කොටස් ක්‍රියා කරන අයුරු සලකා බලන්නෙහි නම්, ඔබේ මැවුම්කරු සමිඳුන් කොපමණ උත්කෘෂ්ට දැයි ඔබට වැටහේ. තවද උන්වහන්සේගේ මැවිලි ඔබ විසින් රස විඳිනවාට, උන්වහන්සේ කැමතිදැයි ඔබට පෙනෙනු ඇත.



## එතුමන් මා මැව්වේ මන් ද ?

උන්වහන්සේ සමග පුද්ගලික සම්බන්ධතාවයකට සතුන්ට පැමිණිය නොහැකිය. එහෙත් ඔබට එසේ කළ හැකි ය. ඊට හේතුව නම්, උන්වහන්සේ ඔබ තුළ නාමය හෙවත් "ස්ප්‍රිතුව'' යන අංගයක් තබා ඇති නිසාය. මේ අංගය වනාහි, ඔබ, යන තැනැත්තාය. මේ අංගයට එනම් නාමයට උන්වහන්සේගේ නාමය හෙවත්, ශුද්ධාත්මය සමග සම්බන්ධ විය හැකි ය. ඇසුරු කළහැකි ය. සතුන්ට අකුසල් කළනොහැකි ය. ඔබට පුළුවන. ඔබ අතින් කොතෙකුත් අකුසල් සිදුවන්නේ ය. එහෙත් සමිඳුන්ට ඔබ ඉතා අගනේ ය. අන් සියල්ලට වඩා ඔබව උන්වහන්සේ අගය කරනසේක. තවද ඔබ උන්වහන්සේට සමීපවී උන්වහන්සේ හා සමඟ කථා බස් කිරීමට උන්වහන්සේ අපේක්ෂා කරන සේක. ඔබේ තනිකම මකාගත හැක්කේ, එතුමන් සමග පුද්ගලික ඇසුරකට පැමිණීමෙනි. එතුමන් සමග ආදර මිතුරුකමට ඇතුලත්වීම එතුමන් ඔබෙන් අපේක්ෂාකරයි. මැවුම්කරුතුමන් ඔබ මැව්වේ, උන්වහන්සේගේ ආදරය කරණකොටගෙන ය. මව්කුසේදී ඔබව තැනුවේ

උන්වහන්සේය. ඔබ මේ ලෝකයෙහි සිටින්නේ අහම්බෙන් නොව, දැන් ඔබ මේ පත්‍රිකාව කියවන්නෙත්, උන්වහන්සේගේ සැලැස්ම ඔබට අනාවරණය කරන පිණිස ය. ඔබ ගැන පිළියෙල කර ඇති ජීවිතය, අන් කිසියම් කෙනෙකුට ද නොමැත. උන්වහන්සේට ඔබ අසහාය තැනැත්තෙකි. ඔබ විසින් විශේෂ කාර්යභාරයක් කරන පිණිස, සමිඳුන් ඔබට විශේෂ තලෙන්ත හා හැකියාවන් දී ඇත. ඔබ ඔබගේ ජීවිතය හා මේ සියල්ල උන්වහන්සේට කැපකළ විට, ඔබ ගැන උන්වහන්සේගේ අදහස ඉෂ්ඨ කරනු ඇත. ඔබට උන්වහන්සේ බොහෝ ආදරය කරනසේක. ඔබද මුළු සිතින්ද, මනසින්ද, ශක්තියෙන්ද උන්වහන්සේට ආදරය කිරීම ඔබෙන් උන්වහන්සේ බලාපොරොත්තුවනසේක. තවද ඔබටම ඔබ ආදරය කරන ලෙස, අනුන්ට ද ඔබ ආදරය කිරීම ඔබට නියම කරන සේක. ලෝ මැවීමට පෙර පවා, ඔබ ගැන උන්වහන්සේට සැලැස්මක් තිබුණි. ඔබ තුළ උන්වහන්සේගේ ක්‍රියාකාරීත්වය තුළින්, ඔබට යහපත් ක්‍රියා කිරීමට තිබේ. ඔබ තුළ, උන්වහන්සේගේ සියළු ගුණ ලක්ෂණ ඇති කිරීමට උන්වහන්සේගේ අභිප්‍රායයි.

##  මැවුම්කරුතුමන් කුමන ආකාර කෙනෙකු ද ?

එතුමන් සර්වසාධාරණය, අති ශුද්ධය, සම්පූර්ණයෙන් පිවිතුරුය, සියලු බලයෙන් යුක්තය, සෑම තැනම එක් වරම වැඩ වසන සේක. එතුමාණෝ සියල්ල දන්නා සේක, සර්ව ප්‍රඥාවන්තය, කිසිදා වෙනස්නොවනසේක. එතුමාණෝ ආදරයෙන් පරිපූර්ණය, ඉතා යහපත්ය, සාධාරණමය, සර්වසම්පූර්ණ ස්වාමීන්වහන්සේය. තවද උන්වහන්සේ අති විශාල ආදරයකින් ඔබට ආදරය කරනසේක. උන්වහන්සේගේ අභිප්‍රාය ඔබ උන්වහන්සේ සමග සමීප සම්බන්ධතාවයකට පැමිණවීමයි. බාහිරව හටගන්නා කිසි දෙයකට ඉවත් කළ නොහැකි ඇතුලාන්ත ශාන්තියක්, සමාධියක්, ඔබ තුළ උන්වහන්සේට ඇති කළහැකි ය. ආදරය ලැබීමේ, ඔබ තුළ ඇති අවශ්‍යතාවය, උන්වහන්සේට සපුරාලන්නට හැකිය. මන්ද, ඔබ කුමන තැනැත්තෙකු වූවත්, කුමන දෙයක් කළත්, උන්වහන්සේ ඔබට ආදරේ කරන සේක. අන් කිසිවෙකුට ඒ ආදරයෙන් ඔබ ඉවත් කළ නොහැකි ය. ඔබේ සියලුම අවශ්‍යතාවයන් උන්වහන්සේ දන්නා සේක (ශාරීරික, ආර්ථික, හැඟීම් පිළිබඳව, මානසික හා අධ්‍යාත්මික). ඔබ රෝගීව සිටින්නෙහි නම් ඔබ සුවකිරීමට උන්වහන්සේ සතුටුය. හැඟීම් වලින් පීඩනය තිබෙනම් සහනය දීමට සතුටු ය. මැවුම්කරු සමිඳුන් ඔබේ ස්වභාවොත්තර පියතුමා ය. දයාබර දෙමාපියකු ලෙස ඔබට ඉතා ආදරයෙන්, කරුණාවෙන් සලකන සේක. ආකාසයේ පක්ෂීන්ට, උන්වහන්සේ ආහාර සපයන සේක. කෙතෙහි මල් අලංකාරව පළඳවන සේක. තම දරුවන්ට ඊට වැඩියෙන් ආදරයෙන් සලකන සේක. තම දරුවන් එතුමන්ගේ රාජ්‍යය ගැන නිසිලෙස සලකමින්, සාධාරණකම ඉටුකරමින් ජීවත් වන්නේ නම්, එතුමන් තම දරුවන්ගේ සෑම අවශ්‍යතාවයන්ම සපුරාලනසේක. ආදරය, ප්‍රීතිය, ශාන්තිය, සහනය ඔබට ප්‍රදානය කිරීමට උන්වහන්සේ ඉතා ආශාවෙන් බලාසිටින

සේක. ඔබට ප්‍රශ්න ගැටළු ඇතිවන කල, ඔබට පිහිටවීමට ඉතා සතුටින් ඔබට සමීපව සිටින සේක. බයිබලයේ ගීතාවලිය නම් පොතේ මෙසේ සඳහන්වේ. "ඔබට භය ඇති කල්හි උන්වහන්සේ කෙරෙහි විශ්වාස කරන්න.'' (ගීතාවලිය 56:3). ඔබ අතින් අකුසල් සිදුවුනත් වරදකට ඇබ්බැහිවූවත් එයින් ඔබ මුදා ගැනීමට උන්වහන්සේ බලා සිටින සේක. ඔබේ පියා ඔබට ආදරය නොකළේ නම්, පියවූ සමිඳුන් ඒ අඩුව සපුරාලන්නට ඉතා සතුටුය. ඔබ තුළ තිබෙන පාළු ගතිය, උන්වහන්සේට මකා දැමිය හැකි ය. උන්වහන්සේ ඔබ උදෙසා පිළියෙල කළහැකි සියල්ල ඔබට අත්පත් කරගැනීමටනම්, ඔබ අධ්‍යාත්මික ලෙස උන්වහන්සේගේ දරුකමට උත්පාදවී, උන්වහන්සේගේ රාජ්‍යයට ඇතුළත් විය යුතු ය. ඔබගේ වැදගත්ම අවශ්‍යතාවය මෙයයි. ඔබ මෙසේ අධ්‍යාත්මික ලෙස උත්පාද වූ කල, උන්වහන්සේ ඔබේ පියාණන් වනසේක. උන්වහන්සේ ද ඔබට පීතෘ ආදරයෙන් සළකන සේක.

ඔබේ දෛවය ඔබ විසින් පිළිගත යුතු නැත. මන්ද ඔබට ඉතා අනර්ඝ ඉරණමක් උන්වහන්සේ පිළියෙල කර ඇත. එබැවින් ඔබට කේන්දර, පොරොන්දම් යනාදිය සලකන්නට කොහෙත්ම ඕනෑවන්නේ නැත. මන්ද සෑම දිනක්ම ඔබට යහපත් දිනක් වනු ඇත. උන්වහන්සේ පිළියෙල කර ඇති සැලැස්ම ඔස්සේ ඔබ ජීවත්වන කල, ඔබ කලින් සිටි තැනැත්තා නොව, අළුත්ම අළුත් තැනැත්තෙකි.



## සත්‍යය යනු කුමක්ද? එය මා සොයාගන්නේ කෙසේ ද ?

සත්‍යයයි ඔබ සිතන දේ සත්‍යයම නොවෙන්නට පුළුවන. මන්ද සත්‍යය මනුෂ්‍යයෙකුගේ සිතුම් පැතුම් වලට, මත වලට, සමාන නොවේ. තවද එක් එක්කෙනාගේ මත වෙනස්මය. නුමුත් සත්‍යය අපට පිටතින් පවතින්නාවූ වෙනස් නොවන යථාර්ථයකි. ''එබැවින් යේසුස්වහන්සේ තමන්ව අදහාගත් යුදෙව්වරුන්ට කියනසේක්: ''නුඹලා මාගේ වචනයෙහි පවතිනවානම් සැබෑවට නුඹලා මාගේ ගෝලයෝය; නුඹලා සැබෑව දැනගන්නවා ඇත, සැබෑව ද නුඹලා නිදහස් කරන්නේයයි කීසේක.'' ඔව්හු උන්වහන්සේට උත්තර දෙමින් අපි කිසිවෙකුට වහල් නූණෙමු. නුඹලා නිදහස් වන්නහුයයි කියන් කොහොමදැයි කීවෝය. යේසුස්වහන්සේ ඔවුන්ට උත්තර දෙමින් : ''සැබවක් සැබවක් නුඹලාට කියමි පව්කරන සියල්ලෝ පාපයාගේ වහල්ලුය. වහලා නිතරම ගෙදර නැවතී නොසිටියි. පුත්‍රයා නිතරම නැවතී සිටියි. එබැවින් පුත්‍රයා නුඹලා නිදහස් කරන්නෙහිනම්, සැබවින් නුඹලා නිදහස් වන්නෙහුය. මාගේ පියාණන්වහන්සේ ළඟදී දුටුදේ මම කියමි.'' යොහන් 8:31,32,34.

මැවුම්කාර සමිඳුන් තරාතිරම් නොබලනසේක. ඔබ කුමන පසුබිමෙන් පැමිණියත් කම් නැත. ඔබට උන්වහන්සේගේ දරුවෙකු විය හැකිය. ඔබ දැන පිහිටා සිටින දර්ශණය හෝ ඔබ වරක් දැරූ දර්ශණය විසින් සත්‍යය නොසෑදේ. සත්‍ය වනාහී සර්ව සම්පූර්ණය. ඔබ සත්‍ය සෙවිය යුතුයි. එවිට සත්‍ය ඔබ නිදහස්

කරනු ඇත. ආගමිකවතාවත් පැවැත්වීමෙන්, ඔබට ස්වර්ග රාජ්‍ය හිමිවන්නේ නැත. මැවුම්කරු සමිඳුන් වැඩවසන්නේ ස්වර්ග රාජ්‍යයේය. උන්වහන්සේගේ අභිමුඛත්වයට පැමිණිය හැක්කේ තමාගේ කිසියම් හැකියාවකින් හෝ දක්ෂතාවයකින් නොවේ. එතුමන් සමග මිත්‍ර ඇසුරකට පැමිණීමෙන් ඔබගේ අකුසල් අහෝසි කරනු ඇත. ඔබ සමාව අත්දකිනු ඇත. මෙසේ ඔබේ ජීවිතයේ ඇතුලාන්තය වෙනස් වීමක් සිදුකරගෙන එතුමන් ඔබගේ හිමිකරු කරගෙන, මේ ජීවිත කාලයේදීම සදාතන ජීවනය අත්දකින්නෙහි නම්, පරලොවදී ස්වර්ග රාජ්‍යයට ඔබ පිවිසෙන්නෙහි ය. සමිඳුන් වෙත භක්තියෙන් ළඟාවී, තම හදවත් පිවිතුරු කරගෙන, උන්වහන්සේට තම ජීවිතයේ හිමිකරු වීමට ඉඩ දෙන තැනැත්තෝ පමණක්, ස්වර්ග රාජ්‍යයට පිවිසෙන්නෝ ය. මෙලොවින් මතු ස්වර්ග රාජ්‍යය හිමිකරගන්නා අතර, වර්තමානයේදීම නව ජීවනයක් අත්පත් කරගන්නෝ ය. මේ ජීවනය සදාතනික ජීවනයකි. දේව දරුවන් බවට උත්පාදනය වන අයට උන්වහන්සේ පුදුමාකර සම්පත් ස්වර්ග රාජ්‍යයේදී පිළියෙල කර ඇත. අපේ ඇසින් නොදුටු මනසින් නිර්මාණය නොකළ භාග්‍යයක් අපට පිළියෙල කර ඇත. ඒ සම්පත් හිමිකර ගැනීමට සැරසෙන ලෙස, මේ ජීවිත කාලයේදී අප ජීවිතය ගත කිරීමට උන්වහන්සේ පිහිට වන සේක. මේ අනිත්‍ය වූ තාවකාලික ජීවිත කාලය ඉතා කෙටිය. එහි ඇතිවන දුක් කම්කටොලු තාවකාලිකය. එහෙත් ස්වර්ග රාජ්‍යයේ සම්පත් සදාතනිකය. ශාරීරික මරණය අපට උරුමය. මරණය සමිඳුන්ගේ අභිමුඛත්වයට පැමිණීමට දොරකඩ පමණය. ස්වර්ගයෙහිදී උන්වහන්සේ ඉදිරියේ, ඔබ මුණගැසෙනවාට මම කැමැත්තෙමි.

##  ස්වර්ග රාජ්‍යයෙහි දුක තිබේ ද ?

නැත, කොහෙත්ම නැත. "උන්වහන්සේ ඔවුන්ගේ ඇස් වලින් සියලු කඳුළු පිසදමනසේක; මරණය තවත් නොවන්නේය; වැලපීමත් හැඬීමත් වේදනාවත් තවත් නොවන්නේය. මක්නිසාද පළමු දේවල් පහව ගියේයයි සිංහාසනයෙන් කියන මහත් හඬක් මට ඇසුණේය. ඔවුන්ට තවත් බඩගිනිවන්නේවත් පිපාසා වන්නේවත් නැත; සූර්ය රශ්මියවත් කිසි රස්නයක්වත් ඔවුන්ට පහරදෙන්නේ නැත. මක්නිසාද සිංහාසනය මැද සිටින බැටළුපැටවාණෝ (යේසුස්) ඔවුන්ගේ එඬේරා වී, ජීවන-දිය- උල්පත්වලට ඔවුන් ගෙනයනසේක. සමිඳුන්ද ඔවුන්ගේ ඇස්වලින් සියලු කඳුළු පිසදමනසේකැ''යි කීවේය. එළිදරව් 21:4; 7:16,17.

##  මැවුම්කරුතුමන් ගැන නියම සත්‍යය දැනගන්නේ කෙසේ ද ?

මැවුම්කාර සමිඳුන් අසීමිතය. උන්වහන්සේ සම්පූර්ණයෙන් වටහා ගැනීමට අපට නුපුළුවන. මන්ද අප සීමිත තැනැත්තන් වන හෙයිනි. උන්වහන්සේ ගැන අනාවරණය කර ඇති දේ පමණක්, අපට වටහා ගත හැකිය. මැවුම්කරුතුමා

අසීමිත චින්තනයක් ඇති කෙනෙකි. මනුෂ්‍යයන් වන අපට ඇත්තේ සීමිත චින්තනයකි. තවද, අපට මනසින් හා පංච ඉන්ද්‍රියන්ගෙන් උපයාගත හැක්කේ සීමිත දැනීමකි. නොයෙක් ආගම් ඇති වී තිබෙන්නේ, මිනිසා මැවුම්කරුතුමන් හෝ සත්‍යය හෝ සොයාගැනීමට වීර්‍යය කළ නිසාය. මැවුම්කරුතුමන් සම්පූර්ණ සත්‍යය වනසේක. ඉන් එහි සත්‍යයක්ද නැත. මෙය සම්පූර්ණ සත්‍යය දැනගැනීමට මනුෂ්‍ය චින්තනය අපොහොසත් නමුත්, උන්වහන්සේගේ මහා ආදරය නිසා අපට තමන් ගැන එළිදරව් කිරීමට උන්වහන්සේ සතුටු වූසේක. උන්වහන්සේ අපට සෑහෙන තරම් අනාවරණය කර තිබේ. අපට අවබෝධ කරගත හැක්කේ එපමණය.

බයිබලය සර්ව ප්‍රකාරයෙන්ම සත්‍යවාදී පොතකි. එය මැවුම්කරුතුමන් විසින්ම විශේෂ පණිවිඩකරුවන් ලවා ලියවන ලදී. මෙය කරනු ලද්දේ දැනට අවුරුදු 3,500 කට පෙර සිටය. එය ලිවීමට අවුරුදු දහසක් (1000) පමණ දීර්ඝ කාලයක දී පණිවිඩකරුවන් 40 දෙනෙක් පමණ යොදවන ලදී. එහෙත් එය තුළ රන්හුවක්සේ, ලෝසතාගේ ගැලවීම හා ගැළවුම්කරුතුමා ගැන දිගටම ලියැවේ. බයිබලයෙහි සඳහන් යෝබ් නැමැත්තා මීට අවුරුදු 4000 පමණ පෙර, ''මේ ලෝක ගෝලය, මැවුම්කරුතුමා ගුවනේ එල්ලා තිබෙන බව ප්‍රකාශ කර තිබේ.'' මේ නියාමය, විද්‍යාඥයින් සොයාගැනීමට ශතවර්ෂ කීපයකට පෙර යෝබ් තුමා කීය. (යෝබ් 26:7).

උන්වහන්සේ සදාකාලයටම සිටින එකම එක මැවුම්කරුය. එහෙත් උන් වහන්සේ හුදකලා තැනැත්තෙකු නොවේ. උන්වහන්සේ ත්‍රෛ පෞරුෂත්වයකින් යුක්ත වේ. එනම් පියාණෝ ය, සදදරනියාණෝය, ශුද්ධාත්මයාණෝ ය, යනුවෙනි. මේ තැනැත්තන් තිදෙනාම එක්කෙනෙකු වන සේක. එනම් එකම එක මැවුම් කාරතුමාණෝ ය. තම යස ඉසුර තේජස අත්හැර දමා, මනුෂ්‍යත්වය රැගෙන මෙලොවට පහලවී, යේසුස්වහන්සේ යන නාමයෙන් පෙනී සිටියේ, සදදරනියාණෝ ය. මම මෙය සරලව නිදසුන් කරන්නේ නම්, එකම ද්‍රව්‍යයක් වන වතුර, අයිස් (මිදුනු වතුර) හා වාෂ්ප වැනිය. තවත් සරල නිදර්ශණයක් දෙන්නේ නම්, සූර්යයා වැනිය. සූර්යයා තුළ ගිණි ඇති අතර, රශ්මියද ආලෝකයද නිකුත් වේ. මේ තුන් ආකාරයම වෙන් වෙන් වශයෙන් එක් වරම අපට ප්‍රත්‍යක්ෂ කරගත හැකිය. ඔබ ශ්‍රී ලංකාවේ ඉපදුන කෙනෙකු නිසා, ලාංකික පුත්‍රයෙකි. එසේම යේසුස් වහන්සේ මැවුම්කාර සමිඳුන් වෙතින් පැමිණි නිසා, සමිඳු පුත්‍රයාණෝ හෙවත් ස්වාමි දරුවා ය. ''මම පියාණන්වහන්සේ වෙතින් පිටත්ව ලෝකයට ඇවිත් සිටිමි. නැවත මම ලෝකය අත්හැර පියාණන්වහන්සේ වෙතට යමි''යි කීසේක. යොහන් 16:28

උන්වහන්සේ මැවුම්කරුතුමන් සමගම, කාලයට ද පෙර, වැඩසිටි සේක. යේසුස්වහන්සේද මැවුම්කරුතුමන්ය. මේ විශ්ව මණ්ඩලයම සිදුකළේද, පවත්වන්නේද, උන්වහන්සේය. ශත වර්ෂ කීපයකට පෙර, කත්‍යාවක් තුළින් යේසුස්වහන්සේ උපත ලබන බවද, අකුසල් නසන පූජාවක් වශයෙන් අන්ත දුක්ඛිත, සාහසික මරණු ලැබීමේ සවිස්තර ද, භූමිදානය කරනු ලැබීම ද, තුන්වෙනිදා මරු පරදා මරණින් ජයගෙන මරණින් නැගිටින බව ද, ලෝකාන්තිමේ දී, පෙරළා

මිහිපිට පැමිණ, ලොව පුරා සාම පාලනයකින් පාලනය කරන බව ද, බයිබලයේ වාර්ථාකර තිබේ. මේ ලොවෙහි සැබෑ සාමයක් ඇතිවන්නේ, ඒ යුගයේදීය. කිසි චින්තනයකින් දැනගත නොහැකි මැවුම්කරු තුමාණෝ ලෝසතාට එළිදරව් වූයේ යේසුතුමාණන් තුළින්ය. ඔබ යේසුස්වහන්සේ පිළිගෙන, එතුමා හඳුනාගත් කල, එනම්, උන්වහන්සේ සමග මිත්‍රකමට ඇතුල්වූවිට, ඔබට සත්‍යය අවබෝධ වන්නේය. සත්‍යය ඔබ නිවහල් කරනසේක. යේසුස් වහන්සේ මෙසේ ඔබ ඇතුලාන්තයට පිළිගත් විට, ඔබ තුළ වැඩ වසන උන්වහන්සේගේ ශුද්ධාත්මයාණන්වහන්සේ, ඔබට යහපත් සිතුවිලි සිතන්ටත්, විනීත වචන කථාකරන්ටත්, හරි ආකල්ප ඇතුව සිටින්ටත්, සමිඳුන් විසින් ඔබේ සිතෙහි ජනිත කරන දයා කරුණා ක්‍රියා කරන්ටත්, පිහිට වන සේක. සමිඳුන්ගේ සමාව අත්දුටු තැනැත්තෙකුට, උන්වහන්සේගේ දයා කරුණාව තුළින්, පරහට සමාව දීමටද, සමාදානය වීමටද, සමගි වීමටද, පරාර්ථකාමීව ආදරය කරන්ට ද හැකි වන්නේය.

14 වෙනි වියේදී, යේසුස් වහන්සේ මගේම පුද්ගලික ගැළවුම්කරු ලෙස මම දැන හඳුනාගෙන අදහාගතිමි. මා තුළ තිබුණාවූ පාප බර මගෙන් ඉවත් කර, ඒ සියල්ලට සමාව දුන් සේක. ස්වල්ප දිනකට පසුව, ඇදුම රෝගයෙන් මා සුව කළසේක. උන්වහන්සේගේ ශුද්ධාත්මයාණන් මා තුළට එවා, පව් කිරීමේ ගතියෙන් ගලවා ගත්සේක. කිසිම ලෝක සම්පතකින් ලැබිය නොහැකි, පුදුම ප්‍රීතියක් හා ඇතුලාන්ත ශාන්තියක් මා තුළ ඇති කළ සේක. උන්වහන්සේ මගේ ජීවිතය එදා වෙනස් කළසේක. තවද, දිගටම උන්වහන්සේගේ සමානත්‍වයට වෙනස් කරනසේක. මට ජීවිතයේ සැබෑ අර්ථයක්ද, අරමුණක්ද තිබේ. මගේද, මගේ මුළු පවුලේ ද, හා සේවාවේ ද සෑම අවශ්‍යතාවයන් උන්වහන්සේ සපයා ඇත. ඕනෑම වේලාවකදී මා උන්වහන්සේටද, උන්වහන්සේ මටද කථා කරනු ඇත. උන්වහන්සේ මගේ ඉතාම හිතේෂී මිතුරාය. උන්වහන්සේ කිසි දිනක මා අතහැර ගොස් නැත. මා නොයෙක් දුක් වේදනා තුළින් යන අතර, මට පුදුමාකාර අන්දමින් පිහිට වී, මා ගැන ඉතා සියුම් ලෙස අනුකම්පා කර තිබේ. එය ලෝ සතාටම උන්වහන්සේ දක්වන බව මට ඒකාන්තය. ඒ දුක වේදනාව නිසා උන්වහන්සේගේ දයාව කරුණාව හා ආදරයෙන් මා තුළ ඉවසිලිවන්තකම මට අත්වී තිබේ. එබැවින් දුක් වේදනා විඳින්නන් හා සමග මේ සැනසීම හා උන්වහන්සේගේ ආදරය බෙදාගැනීමට මා තුළ අධික ආශාවක් ඇත. ඒනිසා මේ දුක් වේදනා ද, සියලු දේම ද, යහපත පිණිස ක්‍රියා කරන බව මම දනිමි. මෙයද බයිබලයේ රෝම පොතේ සඳහන් වී ඇති පොරොන්දුවකි. මිය යෑම ගැන මගේ කිසි බියක් නැත. එහෙත් මට තව දුරට උන්වහන්සේට සේවය කිරීමට තිබේ. මැවුම්කරුතුමන් ගැන මා ඉහත කී සියලු දේ බයිබලයෙහි වාර්තා කර තිබේ. එය මගේ අත්දැකීමෙන්ම දනිමි. සර්ව සම්පූර්ණ සත්‍යය යනු යේසුස් වහන්සේය. මගේ ලොකුම අපේක්ෂාව නම්, යේසුස්වහන්සේ ගැන මා අත්දකින සදාතන ජීවනය ඔබද ලබාගෙන, සාමාන්‍ය ජීවිතයක භයානක ඉරණම වන අපාගතවීමෙන් ඔබ වැළැක්වීමයි.

මීට අවුරුද්දකට පමණ පෙර, මට විශ්මජනක අත්දැකීමක් ලැබුණි. ආගමික කඳවුරකදී දේව දාසයකු ඉදිරියට මා ගිය කල, ඔහු අනාගත වාක්‍යයක් මා හට මෙසේ පැවසීය. "ඉශ්‍රායෙල්හි මව, ඔබේ උද්‍යෝගය මැවුම්කාරයාණන් වහන්සේ දැක තිබේ. ඔබ ස්වාමීන්වහන්සේ ගැන අළුත් දර්ශණයක් දකින්න.'' එකල මා මුණින් ඇද වැටුනෙමි. උස තැනැත්තෙකු ගේ හැඩහුරුකමින් බැබළෙන විශාල සුදු එළියක් බැබළිනි. එය තුළින් යමෙකුගේ සුදු වස්ත්‍රයක් දුටිමි. ඒ තැනැත්තාගේ මුහුණ නම් පෙනුනේ නැත. මන්ද එතැනින් සූර්යයා මෙන් එළියක් දිස්විනි. එකල මා මනසට ගලා ආ චේතනා ගෞරවාන්විතය, මහිමාන්විතය. යමෙකුට කොහෙත්ම කළ නොහැකි දේ සමිඳුන් සමඟ කළ හැකිමය. උන්වහන්සේ මට විශේෂ කාර්යභාරයක් දුන්සේක. ඊට පෙර උන්වහන්සේ මට දේශයන්ට සුවය ගෙන දෙන්නට නියම කළ සේක.

##  මේ ලෝකයේ දුක තිබෙන්නේ මත් ද ?

මැවුම්කරුතුමන් මැව්වේ කිසිම පළුද්දක්, ලෙඩක්, දුකක් ඌනතාවයක් නැති සර්ව සම්පූර්ණ ලොවක්ය. උන්වහන්සේ පළමු මිනිසා සහ ස්ත්‍රිය මැවූසේක. එනම් ආදම් සහ ඒවය. ඔවුන් තුළ උන්වහන්සේගේ ගුණාංග තැබූ සේක. ඒ ගුණාංග අති යහපත්මය. උන්වහන්සේ සමඟ කිට්ටු සම්බන්ධතාවයක් හා හිතෛෂී මිත්‍රකමක් ඔවුන්ට පවත්වා ගෙන යෑමට හැකි විය. ඔවුන්ටද සතුන්ටද ආහාර පිණිස පළතුරු හා පලා වර්ග දුන්සේක. ආදම් සහ ඒව යන්ත්‍රානුසාරයෙන් ක්‍රියා කරන රූකඩ නොවූහ. ඔවුනට නිදහස් කැමැත්ත දුන්සේක. ඒ නිදහස් කැමැත්තෙන්, උන්වහන්සේට කීකරු වීමට හා ආදරය වීමට හෝ අකීකරු වීමට හා ප්‍රතික්ෂේප කිරීමට නිදහස දුන්සේක. උන්වහන්සේ ඔවුන්ට ආශිර්වාද කර, පොළොව සශ්‍රික කර, පාලනය කරන්නැයි කීසේක. සියලු මත්ස්‍යයන්, පක්ෂීන් කෙරෙහි හිමිකම දුන්සේක. සියලු ජාතීන්ගෙන් සියලු ගෝත්‍රයන්ගෙන් යුක්තවූ මුළු මිනිස් වර්ගයාම, පැවතෙන්නේ මේ මුල් දෙමව්පියන් දෙදෙනාගෙනි. අප සියල්ලන් තුළින් ගමන් කරන්නේ ඒ ලේමය.

යක්ෂයා හෙවත් සාතන්, දුෂ්ට භූතාත්මයක් බැවින්, සමිඳුන්ට විරුද්ධව කැරළිකාරව දූත ක්‍රියාකරයි. ඔහු මුලදී මවන ලද්දේ, යහපත් ස්වර්ගීක දූතයෙකු වශයෙනි. එහෙත් ඔහු සහ එවැනි ස්වර්ගීක දූත රැසක් සමිඳුන්ට විරුද්ධව කැරළිකාරවූ නිසා, ස්වර්ග රාජ්‍යයෙන් නෙරපන ලදී. මේ දුෂ්ට දූත පිරිස සඳහා ගිනිවිල හෙවත් නිරය වන අපාය සාදන ලදී. එය සදාකාලික වධ විඳින ලෝකයකි.

ආදම් සහ ඒවට සියකැමැත්තෙන් කීකරුවීමට ප්‍රමිතියක් නොහොත් පිරික්සීමක් සමිඳුන් දුන්සේක. අකීකරු වීමට යක්ෂයා ඔවුන් මුළා කළසේක. යක්ෂයාගේ මුසාව විශ්වාස කර, සමිඳුන්ගේ වචනය හෙවත් විධානය, මොවුන් දෙදෙනා ප්‍රතික්ෂේප කරමින්, කඩකළෝ ය.

ආදම් සහ ඒව මෙසේ සමිඳුන්ට විරුද්ධව ක්‍රියා කොට,

සමිඳුන්ගෙන් බැහැරවී, පිටුපා, සමිඳුන් සමඟ අසමගි වී, විරුද්ධ පක්ෂයට ගියහ. ආදම්, ඒවගෙන්, පැවතෙන අය වශයෙන් අපද, අප වටා ඇති ස්වභාව ධර්මයද එතුමාගේ දඬුවමට ලක්විය. එයින් පොළොවේ කටු ගොකටු හටගත්තේය. පොළොව කර්කශ විය. මිනිසාගේ කුසගිනි නිවාගත යුතු වන්නේ, දහඩිය මහන්සියෙන්ය. මේ කැරළි ගැසීම නිසා, ඔවුන් මත විනිශ්චයක් පැමිණියේය. එය මුළු ලොව මත බලපෑවේ ය. මේ තත්වයට බයිබලය කියන්නේ, පාපය හෙවත් ආත්මික මරණයයි. ලොවේ රෝග, පීඩා හා අසමගිය, සමාදානයක් නැති වියවුලත්, අවසානයේ මරණයත් හටගැනින. යක්ෂයාට සාදනලද අපාය, මිනිසාටද හිමි විය. එබැවින් මේ කැරළිකාර තත්වයේ සිටින මිනිසා, දැන් ගමන් කරන්නේ, සමිඳුන්ගෙන් බැහැරව අපාය කරා ය. අප සියලු දෙනාම ආදම් ඒවගෙන් පැවතෙන්නෝ බැවින්, අපද මැවුම්කාර සමිඳුන්ගෙන් බැහැරවී සිටින්නෙමු. මේ වෙන්වීමට බයිබලය කියන්නේ පාපය කියාය. මේ වෙන්වීම අපේ තත්වය පමණක් නොව, අපේ අභ්‍යන්තරය ස්වභාවයත් වී තිබේ. එබැවින් අප තුළ දැන් මේ ස්වභාවය නැතහොත් පාපය ජන්ම රෝගයක් ලෙස පවතී. මේ රෝගයේ රෝග ලක්ෂණ නම්, අප විසින් සිතින් වචනයෙන් හා ක්‍රියාවෙන් කෙරෙන අකුසල්ය. එනම් මේවාය: උඩඟුකම, හිතුවක්කාරකම, සමිඳුන්ට අකීකරුවීම, උන්වහන්සේගෙන් නිදහස්ව සිටීම, ආත්මාර්ථකාමීබව, කෑදරකම, තණ්හාව, අන් අය ගැන අගුණකීම, වෛරය, කාමරාගය, නපුරු සිතුවිලි, ඊර්ෂ්‍යාව, මිනීමැරුම, මුසාව, සමච්චල් කිරීම, ලිංගික දූෂණ, අමනකම, වංචාව සහ උද්දච්ඡකමය. මේ රෝගය නිසා අප තුළ සමිඳුන් තැබුවාවූ දිව්‍යමය ගුණාංග විකෘති වී ඇත, හීනවී ඇත. ඒ හේතුවෙන් මුළු ලොව මත ඒ ශාපය පවතී. ලෙඩ රෝග, වංසගත, නූපන් දරුවන්ගේ ආබාධ හා භූමි කම්පා, ජල ගැල්ම යානාදිය ඇතිවිය. අපටත් අද සමිඳුන්ට කීකරුවීමට හෝ අකීකරුවීමට නිදහස ඇත.

මැවුම්කාර සමිඳුන් ආදරයෙන් පරිපූර්ණ, කරුණාබරිත තැනැන්වහන්සේ නිසා ඔබේ මේ පාපී තත්වය හා ස්වභාවය අහෝසිකොට, නැවත වරක් ඔබ උන්වහන්සේ සමඟ මිත්‍රකර ගැනීමට, ලොව මැවීමට ප්‍රථමයෙන් ඔබට පුද්ගලිකව ප්‍රේම කරන නිසා, ඔබ සමඟ සමගි වීමට, සම්බන්ධතාවය අලුත් කර ගැනීමට, ඉතාම විශේෂ සැලැස්මක් ක්‍රියාවට යෙදවූසේක. මේ සමගිකමට ඔබ පැමිණෙනු ඉතා ආශාවෙන් බලාසිටිනසේක. මැවුම්කරුතුමන් අති ශුද්ධ හා ධර්මිෂ්ඨ බැවින්, උන්වහන්සේට සමීප වීමටනම්, අපේ හදවත් පවිත්‍ර කරගත යුතුයි. අප දැන් විරුද්ධ පක්ෂයේ සිටින බැවින්ද, අප තුළ පාපය නැමති රෝගය පවතින බැවින්ද, සමිඳුන් සමඟ නැවත සමගි වීමට ආශාවක්වත්, ශක්තියක්වත් නැත. එබැවින් අපි උන්වහන්සේගෙන් බැහැරව සිටින්නෙමු. අප අතින් දහසකුත් අකුසල් සිදුවන්නේය. මමත්වයෙන්ද, උඩඟුකමෙන්ද, තණ්හාවෙන්ද අප පිරී ඇත. අප දුර්වලව රෝගීව කැරළිකාරවම සිටින්නෙමු. ඇත්තෙන්ම අපි විරුද්ධ පක්ෂයට අයත් බැවින් උන්වහන්සේගේ සතුරන්ද වෙමු. නුමුත් අප මවන ලද්දේ

උන්වහන්සේගේ මිතුරන්ව මිත්‍ර ඇසුරෙන් ජීවත් වීමටය. මරණයෙන් පසු සදාකාලයටම උන්වහන්සේ සමග ප්‍රීතියෙන් විසීමටය.



## අපේ අකුසල්වලට වඩා කුසල් කිරීමෙන් අපට යහපත් තැනකට ගිය නොහැකි ද ?


පහත සඳහන් නිදර්ශනය, සමිඳුන් හා අප අතර පවතින පරතරය ගෙන හැර දක්වයි. මේ දැක්වෙන්නේ මැවුම්කාර සමිඳුන්ගේ රාජ්‍යයය. උන්වහන්සේව නිරූපණය කරන්නේ ත්‍රිකෝණයකිනි. උන්වහන්සේ මේ රාජ්‍යයේ රජතුමාය. උන්වහන්සේගේ රාජ්‍ය ආලෝකයේ රාජ්‍යයය. චිත්‍රයේ අනික් පැත්තේ පෙනෙන්නේ යක්ෂයා හෙවත් සාතන්ගේ රාජ්‍යයය. අප දැන් සිටින්නේ ඔහුගේ රාජ්‍යයේය. ඒ රාජ්‍යය අන්ධකාරයේ රාජ්‍යයයි. චිත්‍රයේ මිනිසාගේ රූපය පෙන්වා ඇත. මිනිසා කොපමණ තැත් කළත් මේ පරතරය තරණය කළනොහැකිය. ආගමික ක්‍රියාවලින්වත්, එසේ කළනොහැකිය. අපේ වචන හා චේතනා පවා, සමිඳුන් විනිශ්චය කරනසේක. යමෙක් ස්ත්‍රියකු දෙස කාමරාගයෙන් බැලුවහොත් ඔහු සිතින් කාමයේ වරදවා හැසිරේ. අප කවුරුත් කියන්නේ මිනීමරුවෙකුට දඬුවම් කළයුතුයි කියා ය. සමිඳුන් කියන්නේ වෙන කෙනෙකුට වෛර කරන්නේ නම් එය මිනීමැරුමකට සමාන බවයි. මිනිසාගේ අභ්‍යයන්තරයේ නොයෙකුත් නරක වැරදි හටගනී. මේ දේ ඔහුව අපවිත්‍ර කරයි. ඔබ දන්නා හොඳදේ නොකිරීමද, අකුසලකි. තමන් තුළම පවතින ශීලයෙහි කිසිවෙකු සෑම විටම පිහිටා සිටියේ නැත.



## ඔබට අනුන්ගේ වැරදි පහසුවෙන් පෙනේ එහෙත් ඔබ ද ඒ වැරදිම කර නැත් ද ?

''එබැවින් අන්‍යයන් විනිශ්චය කරන ඔබ කවරෙක් වුවද, ඔබේ නිදහස උත්තරයක් ඔබට නැත. මන්ද, අන් කෙනෙකු විනිශ්චය කරන විට ඔහු කරන දේ ම ඔබ ද කර නිසා ඔබ වරදකරුවෙකු බවට තීන්දු වී සිටින්නෙහි ය. එවැනි දේ කරන්නන්ට විරුද්ධව මැවුම්කරුතුමන්ගේ විනිශ්චය සාධාරණ බව අපි දනිමු. ඔබ එබඳු දේ කරන්නන්ට විනිශ්චය කරමින්, ඔබත් එම දේ ම කරන්නෙහි නම්, ඔබ මැවුම්කරුතුමන්ගේ විනිශ්චයෙන් බේරෙනු ඇතැයි සිතන්නෙහි ද? නැත්නම්, මැවුම්කරුතුමන්ගේ මහා කරුණාව, ශාන්තිය හා ඉවසීම සුළුකොට ඔබ සිතන්නෙහි ද? ඒ දිව්‍ය කරුණාවේ අරමුණ ඔබ පසුතැවිල්ලට පැමිණවීම බව දන්නේ නැද්ද එහෙත් ඔබ මුරණ්ඩු ය; දරදඬු සිතක් ඔබට ඇත. ස්වකීය සාධාරණ විනිශ්චය එළිදරව් කරන්නට යන දේව උදහසේ දවසට ඔබ දුර්විපාක රැස් කරන්නෙහි ද? ඒ දවසේදී උන්වහන්සේ හැම මිනිසෙකුටම ඔහුගේ ක්‍රියා අනුව විපාක නියම කරනු ඇත.'' රෝම 2:1-5. එබැවින් ඔබටද නිදහසට කරුණක් නැත. එබැවින් සියලු මිනිසුන්ට නියම වී තිබෙන අන්තිමේදී පැවැත්වෙන මහා විනිශ්චයේදී උත්තර දීමට ඇත. සියල්ලන්ම වැරදිකරු බවට දැක්වේ. මන්ද එදින අපේ හදවතේ සියලු රහස් හෙළි කරනු ලැබේ. එකල අප කර ඇති සෑම ක්‍රියාවක් ගැනද, පවසා ඇති

සෑම වචනයක් ගැනද, සෑම චේතනාවකටම උත්තරදීමට තිබේ. තවද එක් වරක් මරණයත්, ඉන්පසු විනිශ්චයත් මනුෂ්‍යයන්ට නියමව තිබෙන්නාක්මෙන්, (හෙබ්‍රෙව් 9:27) බයිබලය ඉතා පැහැදිලිව ප්‍රකාශ කරන්නේ මීට පෙර හෝ මේ ජීවිතයෙන් පසු අපට නිදෙස් වීමට අවස්ථාවක් නැතිබවය. අති ශුද්ධ මැවුම්කරුතුමන් හා ඔබ අතර ඇති පරතරය ඔබට තරණය කළ නොහැකි තරම් අති විශාලය. ඔබේ කිසියම් කුසල ක්‍රියාවලින් හෝ පූජා පැවැත්වීම වැනි වත්පිළිවෙත් පැවැත්වීමෙන් හෝ දුෂ්කර ක්‍රියා කිරීමෙන් හෝ උගත් කමින් හෝ වැදගත් උපතින් හෝ ඇති දැඩිකිරීමෙන් හෝ සහජ කුසලතාවයන් හෝ ඔබේ මතමතාන්තර හා දර්ශණවාදීන් හෝ ධනයෙන්, බලයෙන්, හෝ ජනප්‍රියත්වයෙන් හෝ ආගමික කැපවීමෙන් හෝ, ඔබේම ජීවිත බලාපොරොත්තුවෙන් හෝ ඔබේ ඕනෑම ධාර්මික හැඟීමක් තුලින් හෝ එසේ කළ නොහැකිය. දැනීම හා අධ්‍යාපනය ඔබට අවශ්‍ය සියල්ලයයි ඔබ සිතාගෙන, ඒ ගැන ඔබ බොහෝ වෙර දරනවා ඇත. අපේ සරසවි වල මා අවුරුදු 34 ක් උගන්වා තිබේ. සරසවිවල කරන්න තැත්කරන්නේත් අධ්‍යාපනය හා දැනුම තුළින් යහපත් මනුෂ්‍යයන් බිහිකිරීමය. එහි අසාර්ථකත්වය මා දැක තිබේ. ලොව පුරාම දැනීම අධික වී තිබේ. එහෙත් ඒ හේතුවෙන් මනුෂ්‍යවර්ගයා වඩා යහපත්වී නැත. මිනිසා අතරින් ඉතාම දැහැමි තැනැත්තා වුවද, සමිඳුන්ගේ මහිමයේ ප්‍රමාණයෙන් ඌනව සිටියි. මන්ද, අපේ සියලුම යහපත් ක්‍රියා පැළඳ සිටියත්, එය සමිඳුන් ඉදිරියෙහි 'කිළිටි වැරහැලි' වේ. මන්ද අපේ හදවත් කිළිටුය. ''මිනිසෙකු වපුරන සෑම දෙයම ඔහු



නෙලා ගන්නේය.'' ගලාති 6:7 අපි සියල්ලෝම පාපී ස්වභාවයක් ඇත්තෝ වෙමු. එබැවින් ඔබ කොපමණ වීර්‍යය දැරුවත් ආලෝකයේ රාජ්‍යයට කිසිසේත් ඔබට තරණය කළ නොහැකිය.

යේසුස්වහන්සේ තුළින් පමණකි ඒ තරණය කළහැකි වන්නේ. ඔබ කිසිසේත් නොවටින තැනැත්තෙකු වුවද, අසීමිත අප්‍රමාණ අසංඛ්‍යය කරුණාවෙන් පිරුණු, දයාබර තේජාන්විත මහිමාන්විත මැවුම්කරුතුමන්ම, තම ඉමහත් දයාකරුණාවෙන්, ඔබේ වන්දිය තමන්ම ගෙවා, උන්වහන්සේගේ සාධාරණත්වය ඔබෙන් නොගෙන, තමාම ඉෂ්ඨ කරනසේක. ඔබට මෙසේ උන්වහන්සේගේ සමාව නොමිලේ ලබාගෙන, දේවරාජ්‍යයට දන් ඇතුළත් විය හැකිය. යේසුස්වහන්සේ කුරුසිය මත පූජාකළ පව් නසන යාගයෙන්, යක්ෂයා සම්පූර්ණයෙන් පරාජය කොට, ඔහුගේ ඔදබිඳ, ඔහු නිරායුධ කර, අපායද, මරණයද, සොලවා පෙරළා, මරණින් නැවත නැගිට, ඒ මහා විජයග්‍රහණය මොනවට ගෙනහැර දක්වූසේක. ජයාන්විත ජීවමාන යේසුස් වහන්සේ මේ පරතරය තරණය කරන එකම එක තැනැත්තාය. යේසුස්වහන්සේ මැරුණු කුරුසිය මේ පාලම නිරූපණය කරයි. අති උත්තම මහිමාන්විත මැමුව්කාරතුමන් ඔබ කෙරෙහි ඇති උන්වහන්සේගේ ඉමහත් ආදරය නිසා මේ පරතරය තරණය කිරීමට අපට පාලමක් දුන් සේක. එනම් යේසුස් වහන්සේය.

යේසුස් වහන්සේගේ ජීවිත කථාව සලකන්න. මෙය ඉතා චමත්කාර දයා කරුණාවේ කථාවකි. ඇසින් දුටු අය විසින්, ඉතා විශ්වාසවන්තව වාර්තා කෙරුණු මේ සටහන් කීපයම, එනම් මුළු අළුත් ගිවිසුමම, ක්‍රිස්තු වර්ෂ 70 පෙර, ලියන ලදී. ඉතාම ශ්‍රේෂ්ඨ බයිබල් විශාරදයින් හා අන්‍යය භක්තික ඉතිහාසඥයින් අළුත් ගිවිසුමේ කරුණු සනාථ කර ඇත. ලෝක ඉතිහාසයද, ක්‍රිස්තු වර්ෂයට පෙර හා, ක්‍රිස්තු වර්ෂයට පසු, ක්‍රිස්තු උපතෙන් බෙදී ඇත කියා. ඔබේ මැවුම්කරු සමිඳුන්ට, ඔබ ඉතාම අගනා කෙනෙක් හෙයින්, ඔබ උදෙසා උන්වහන්සේ සියල්ල දුන්සේක. උන්වහන්සේම ඔබේ අකුසල්වල එල විපාකය අහෝසි කර, ඔබේ පාපය නැමති රෝගයෙන් ඔබ සුවපත් කර, ඔබ මුදවා ගැනීමට මෙලොවට වැඩම කර තම නිර්මල නික්ලේසී ජීවිතය පූජාකළ සේක. මෙසේ කළේ තම සදාදරනියාණෝ වන යේසුස් වහන්සේ තුළිනි. ඔබ උදෙසා පමණක් වුවද, එනම් එක තැනැත්තෙක් උදෙසා වුවද, උන්වහන්සේ මේ දේ කරන සේක. හිතවත, ඔබට උන්වහන්සේ කොපමණ විශාල ආදරයකින් ආදරය කරන සේක්ද! ඔබ උදෙසාම මේ දේ කළසේක.

''උන්වහන්සේ මැවුම්කරුතුමන්ගේ රූපාකාරය දරනසේක්, උන්වහන්සේට සමානව සිටීම තමන් විසින් අල්ලාගනම සිටිය යුතුවූ වස්තුවකැයි නොසිතා, එය ඉවත් කර, දසයෙකුගේ ස්වරූපය ගෙන, මනුෂ්‍යයාගේ සමානත්වයට පැමිණි සේක. මනුෂ්‍යාකාරයෙන් සිටිය කලත්, මරණය, එසේය, කුරුසියේ මරණය දක්වා කීකරුවූ සේක. එබැවින් ස්වාමීන්වහන්සේ උන්වහන්සේව ඉතා උසස්කොට,

සියළු නාමවලට වඩා උසස් නාමය උන්වහන්සේට දුන්සේක. එසේ කළේ ස්වර්ගයෙහිද පොළොවෙහිද පොළොව යට ද සියල්ලන් යේසුස් යන නාමයෙන් දණ නමන පිණිසත්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ස්වාමීන් වහන්සේ බව පියවූ සමිඳුන්ගේ ගෞරවය සඳහා සියලු දිව් වලින් ඒත්තු ගන්න පිණිසය.'' (පිලිප්පි 2:6-11).

මීට වඩා අතිවිශාල ආදරයක් ඔබ අසා තිබේද? ඔබට සිතන්නවත් පුළුවන්ද?



## මා පමණක් උදෙසා වුවද, එතුමන් මේ දේ සිදු කළේ මට මෙතරම් ආදරයක් තිබුන නිසා ද?

අන් සියල්ලම සුදනන් වී, ඔබ එකම දුදනා වුවත්, ඔබට ඇති මහත් ආදරය නිසා මේ සියල්ල කරනවාමය. මීටත් වඩා මහත් ආදරයක් ඔබ අසා ඇත්ද? නැත. කොහෙත්ම නැත. මීට වඩා මහත් ආදරයක් නැත. බැටළුවන් සියයක් සතු එඬේරෙක් ගැන යේසුස් වහන්සේ උපමාවක් කීසේක. ඔහුගේ එක බැටළුවෙක් නැතිවුනත්, 99 ම ගාලේ තබා, නැතිවූ එක බැටළුවා සම්භවන තුරු ළඟ සොයා යයි. ඒ එක නැතිවූ බැටළුවා සම්භවන, විට ඒ එඬේරා ~~නැතිවුණු~~ 99 ට වඩා, මේ එක බැටළුවා ගැන ප්‍රීති වෙයි. යේසුස්වහන්සේ මෙසේ කීසේක. ''එසේම මේ බාලයන්ගෙන් එක්කෙනෙක්වත් විනාශවෙනවාට ස්වර්ගයෙහි සිටින නුඹලාගේ පියාණන්වහන්සේ කැමති නොවනසේක.'' මතෙව් 18: 14 තවද උන්වහන්සේ මෙසේ පැවසූසේක. ''මම යහපත් බැටළු එඬේරාය. යහපත් බැටළු එඬේරා, තමාගේ ජීවිතය බැටළුවන් උදෙසා දෙන්නේය.'' යොහන් 10:11





## ඔබ යේසුස්වහන්සේගේ ජීවිතයේ පහත සඳහන් කරුණු සලකා බලන්න.

1) ඉශ්‍රායෙල්හි උන්වහන්සේ උපන්නේ, අපේ සංස්කෘතිය වැනි පෙරදිග සංස්කෘතියකය. මැවුම්කරුවාණන්වහන්සේ මිත්‍යාදෘෂ්ඨික පවුලකින් ආබ්‍රහම් නම් එක තැනැත්තෙක් තෝරා පිටතට කැඳවා, ඒ සංස්කෘතියෙන් වෙන්කර, අළුත් ජන කොටසක් බිහිකළ සේක. ඒ ජන කොටස ඉශ්‍රායෙල් ජාතිය විය. මේ ජන කොටස, ශත වර්ෂ ගණනාවක් මුලුල්ලේ ගොඩනගා, උගන්වා, ඒක දේව ධර්මය, මුළු ලොවට උරුම කිරීමට සමිඳුන් ක්‍රියා කළසේක. තවදුරටත් ඔවුනට ලෝ සතා මුද ගැනීමට, මිදුම්කරුතුමෙකු එවන බව පොරොන්දු වූසේක.

2) අන් සියළු පෘතංගජන මිනිසුන් මෙන්, වරදට, අකුසලට, නැඹුරුවීමක් නැතිව නිර්මල නික්ලේසි තැනැත්තෙකු ලෙස, යේසුස්වහන්සේ මෙලොවට බිහිවූ සේක. උන්වහන්සේට මනුෂ්‍ය පියෙකු සිටියේ නැත. නුමුත් මැවුම්කරුතුමන් කන්‍යා මෙනවියක් තුළ, හාස්කමකින් යේසු බිළිඳා පිළිසඳගත්සේක. දස මසකින් මරියතුමිය

යේසුස්වහන්සේ ප්‍රසූත කළසේක. මෙලෝ පියෙකු නැතිව බිහිවූ නිසා, යේසු තුමන් ආදම්ගෙන් පැවතෙන, පාපකර්මය නොමැතිව, නිර්මල ළදරුවෙකු වශයෙන් උපන් සේක. යේසු තුමන් මිනිසත් බවගත් මිනිස් දරුවකු වශයෙන් දෙමාපියන්ට, ගුරුදෙගුරුන්ට කීකරුවූසේක. උන්වහන්සේ ශරීරාකාරයෙන්ද, අධ්‍යාත්මික වශයෙන්ද වැඩුණුසේක, ස්වර්ගීය පියාණන් ඉදිරියේද, සෙසු මිනිසුන් ඉදිරියේද, ඉතා ප්‍රිය ජනක තැනැත්තෙකු වූසේක.





3) යේසුස්වහන්සේගේ මුළු ජීවිත කාලය තුලදීම නිර්මල පිවිතුරු, සර්ව සම්පූර්ණ ජීවිතයක් ගතකර, කුරුසිය මත පිවිතුරු යාගයක් පූජාකොට, තුන්වෙනිද මරණින් නැගිට, සොහොන් ගෙයින් පිටතට පැමිණි සේක. සොහොන් ගෙය ද හිස් විය. එය මේ දක්වා දක්නට තිබේ. මුළු ජීවිත කාලයේදීම කිසිම අකුසලක් නොකළ, නික්ලේසී, එකම එක තැනැත්තා යේසුස්වහන්සේ වනසේක.

4) සාකෙවුස් නැමැති, පච්කාර රජයේ නිලධාරියාගේ ආරාධනය මත, යේසුස්වහන්සේ ඔහුගේ නිවසට වැඩම කළ අවස්ථාවේදී, ඒ පිලිගැනීම තුළින් සාකෙවුස්ගේ ජීවිතය වෙනස්වී, ඔහු ගැලවීම ලැබීය. ඔහුගේ වංක ජීවිතය නිමාකොට, මිනිසුන්ගෙන් වංචනික ලෙස සොරාගත් මුදල්, ඔවුනට හතර ගුණයක් කොට ආපසු දුන්නේ ය. ඔහුගේ ධනයෙන් අඩක් ද, දිළිඳුන්ට බෙද දුන්නේය. ඉන් ඉක්බිති අවංක රාජ්‍ය නිලධාරියෙක් වූවේය. යේසුස්වහන්සේ හමුවීමෙන් ගණිකාවන්ගේ ජීවිතද වෙනස් විය.

5) යේසුස්වහන්සේ මාංශවත්වූ මැවුම්කරුතුමන් වුවත්, මේ ලොව ජීවත්වූ කාලයේදී, සැබෑ මනුෂ්‍යයෙකු ලෙස ජීවත්වූ සේක. උන්වහන්සේ, උන් වහන්සේටම දුන් නාමය වූයේ "මනුෂ්‍ය පුත්‍රයා" යනුවෙනි. කුසගින්න, පිපාසය, පීඩාව, වේදනාව අත්දුටුසේක. යක්ෂයා විසින්ද, පරීක්ෂා කරනු ලැබූසේක. එහෙත්, කිසිම අකුසලක්වත් කළේ නැත. උන්වහන්සේ ශෝකවන්තන් සමග ඇඬූසේක. ප්‍රීතිවන්තන් සමග ප්‍රීතිවූසේක. මනුෂ්‍යා සමග සම්පූර්ණ අනන්‍යතාවයකට පැමිණිසේක. එබැවින් උන්වහන්සේ ඔබ ගැන මොනවට දන්නාසේක. ඔබේ දුක, වේදනාව, බලාපොරොත්තුව හා ප්‍රීතිය ගැන මනා අවබෝධයක් ඇත. මෙසේ ඔබ හා මා වැනි අය මෙන්ම දුක් කම්කටොළු, පරීක්ෂා මැදින් ගිය හෙයින් අපට පිහිට වන්නට හොඳින් පුළුවනී.

6) එකවරම උන්වහන්සේ මැවුම්කරුවාණෝමය.

අ) උන්වහන්සේ මෙසේ පැවසූසේක.

"පුත්‍රයා නුඹලා නිදහස්කරන්නේනම් සැබවින් නුඹලා නිදහස් වන්නහුය." යොහන් 8:36

"නුඹලා මා තුළෙහි පවතින්නෝ නම්, නුඹලා කැමති දෙයක් ඉල්ලන්න, එවිට නුඹලාට ලැබේ." යොහන් 15:7

"දෙරකඩ නම් මමය. යමෙක් මා කරණකොටගෙන ඇතුල්වේද, ඔහු ආරක්ෂාකරනු ලැබ ඇතුළට සහ පිටතට ගොස් ගොදුරු ලබන්නේය." යොහන් 10:9

"මම ලෝකයේ ආලෝකයය. මා අනුව එන්නා අන්ධකාරයෙහි නොහැසිර ජීවනයේ ආලෝකය ලබන්නේයයි කීසේක." යොහන් 8:12

"ස්වාමීන්වහන්සේ වෙතින් ආ තැනැත්තා මිස අන් කිසිවෙක් පියාණන්වහන්සේ නුදුටුවේය. ඔහු වනාහි පියාණන්වහන්සේ දුටුවේය. සැබවක් සැබවක් නුඹලාට කියමි - අදහන්නාට සදාකාල ජීවනය ඇත්තේය. ජීවනදායක කෑම මමය."

"නුඹලා මා ඇඳිනගත්තා නම් මාගේ පියාණන්වහන්සේත් අඳුනනවා ඇත. මෙතැන් පටන් නුඹලා උන්වහන්සේව අඳුනති, දැකලාත් තිබේයයි කීසේක" යොහන් 6:46-48; යොහන් 14:7

"මම පියාණන්වහන්සේ තුළෙහිත්, පියාණන්වහන්සේ මා තුළෙහිත්, සිටිනසේක යන මාගේ කීම විශ්වාසකරන්න. එසේ නැත්නම් මාගේ ක්‍රියා නිසාම විශ්වාසකරන්න." යොහන් 14:11

"ජීවනදායක කෑම නම් මමය. මා ළඟට එන්නාට බඩගිනි නොවන්නේය, මා කෙරෙහි අදහන්නාට කිසිකලකත් පිපාසා නොවන්නේය." යොහන් 6:35

"නුඹලා වෙත සමාදානය තබා යමි; මාගේ සමාදානය නුඹලාට දෙමි. මා දෙන්නේ ලෝකයා දෙන්නාක් මෙන් නොවේ. නුඹලාගේ සිත් කැළඹෙන්ටවත් භයවෙන්ටවත් නොදෙන්න." යොහන් 14:27

"මමද පියාණන්වහන්සේද එක තැනැත්තායයි කීසේක." යොහන් 10:30

"අහසත් පොළොවත් පහවන්නේය, නුමුත් මාගේ වචන පහ නොවන්නේ ය." මතෙව් 24:35

ආ) ක්‍රිස්තුස්වහන්සේගේ මරණාසන්න අවස්ථාවේදී, මධ්‍යම දවාලේදී, මුළු ලොවම අඳුරුවිය, රාත්‍රිය මෙන් විය. අන්තිම හුස්ම හෙලෙන මොහොතේදී භූමිකම්පාවක් විය. රෝම යුද්ධ කපිතාන්ද, අන් සෙබලුන්ද මේ සියල්ල හා උන්වහන්සේගේ ජයාන්විත පැවැත්ම දැක සුසුම්ලා මෙසේ කීහ. '' ඇත්තෙන්ම මේ සමිඳුන්මය.'' යේසුස්වහන්සේට හිංසාකළ අය වුවද උන්වහන්සේ ගැන පැහැදුනෝය.

ඇ.) අංශභාග රෝගියකු යේසුස්වහන්සේ වෙතට ගෙන ආ කල, උන්වහන්සේ ඔහුගේ අකුසල්වලට පාප සමාව දුන්සේක. සියළු මිනිසුන්ට සමාව දීමට බලය ඇති බව සක්සුදක්සේ දැක්වීමට රෝගයද සුව කළසේක. රෝගියා නැගිට ඇවිද්දේය.

ඈ) අහස් වස්තූන් කෙරෙහි උන්වහන්සේට අධිකාර බලය සතුව තිබිණ. වරක් මුහුදේ කුණාටුවක් සමග සටන් කරන ගෝලයින්ගේ ඔරුවට උන්වහන්සේ මුහුද මත පයින් වැඩම කළ සේක. යේසුස්වහන්සේ බෝට්ටුවට නැගුණ විගසම කුණාටුව සංසිඳුනි. තවත් අවස්ථාවක ඔරුව යාත්‍රා කරද්දී යේසුස්වහන්සේ ඔරුවේ සැතපී සිටිසේක. කුණාටුවක් හමා ඔරුව ගිලෙන්නට ලංවෙත්ම ගෝලයෝ බියට පත්වී යේසුස්වහන්සේ පිබිඳූහ. යේසුස්වහන්සේ නැගිට කුණාටුව නිශ්චල වන්නට විධාන කළ සේක. එකෙනෙහිම කුණාටුව සංසිඳිනි.

ඉ) යක්‍ෂ, භූත, ප්‍රේත, දේශ කෙරෙහි යේසුස්වහන්සේ අධිකාර බලය ඇතුව සිටිසේක. යක්‍ෂාවේශ වූවන්ගෙන් යේසුස්වහන්සේ යක්‍ෂයන් දුරුකළ සේක.

ඊ) උන්වහන්සේ වෙත පැමිණි හෝ ගෙනත ලද රෝගීන් සියල්ලන්ම උන්වහන්සේ සුව කළසේක. අන්ධ, කොර, බිහිරි, ලාදුරු රෝග අංශභාග රෝගි යනාදි රෝගීන් උන්වහන්සේ සුවකළසේක. මැරුණු අයද උන්වහන්සේ නැවත පණ ගැන්වූසේක. යායිරස් නම් නිලධාරීගේ දෙළොස් හැවිරිදි දුව, සහ ලාසරුස් නම් වැඩිහිටියා මරණින් නැගිටවීම ශුභාරංචි වාර්තා කරතිබේ. නායින් නගර වැන්දඹුවගේ එකම පුතා භූමිදානයට ගෙනයනු ලබන අවස්ථාවේදී, අධික දුකින් වැලපෙන ඔහුගේ මව ගැන සමිඳුන් අනුකම්පාවෙන් පිරී ''අඬන්න එපා අම්මේ'' කියමින් මිනියට අත ගසා, ඒ යෞවනයා නැවත පණගන්වා මවට භාරදුන්සේක.

එ) යේසුස්වහන්සේ සිදුකළ හාස්කම් හා පුදුම ක්‍රියා උන්වහන්සේගේ සවභාවෝත්තර බලය ගෙනහැර දක්වයි. උන්වහන්සේ වෙත පැමිණි සියල්ලන් වෙත දයා කරුණාව හා ආදරය මෙයින් මොනවට පෙනේ.

7) මිනිසුන් දුටුවාම, යේසුස්වහන්සේගේ දයානුකම්පාව තමා තුළ පැන නැග්ගේය. ඒ කාලයේදී ලාදුරු රෝගීන්, සමාජයෙන් පිටුවහල් කරනු ලැබ, මිනිස් සාමාජයෙන් ඈත්ව සිට, ''අපි කිලිටුය'' කෑ ගසා, සිඟමන් ඉල්ලන්ට අණ ලැබ සිටියහ. කිසිවෙක්

ඔවුන්ට අත නොගැසූහ. ඔවුන්ගේ සෙවනැල්ලවත් වැටෙන්න නැති තරමට ලඟින් නොගියහ. වරක් ලාදුරු රෝගියෙක් යේසුස්වහන්සේට, තමා සුව කරන්නැයි ඇත සිට හඬ නැගුවේය. යේසුස්වහන්සේ ඔහුගේ ශාරීරික හා අධ්‍යාත්මික අවශ්‍යතාවය ගැන දයානුකම්පාවෙන් පිරී ඔහු ලඟට ගොස්, ඔහු ස්පර්ශ කොට, ඔහු සුව කළසේක.

තවද, විශාල ජන සමූහයන් දුටු යේසුස්වහන්සේ, සෑම වේලේම එඬේරෙකු නැති බැටළුවන් මෙන් ඔවුන් තනිවී, නැතිවී, අතරමංවී, සිටින්නේයයි දැක දයානුකම්පාවෙන් ඉපිල ගියසේක. එක් අවස්ථාවක යේසුස්වහන්සේ කාන්තාර ස්ථානයක හුදකලාව සිට ඔරුවකින් වැඩම කළ අවස්ථාවේදී විශාල ජනකායක් උන්වහන්සේ සොයා ආ බැවින් ඔවුන් ගැන මහා දයානුකම්පාවකින් පිරී ඔවුන්ගේ රෝගීන් සුවකළසේක. මාර්ක් 14:13;

තවත් අවස්ථාවක මනුෂ්‍යයන් හාරදහකින් යුත් මහත් සමූහයක් රැස්වූ කල, ඔවුන්ට කන්ට කිසිවක් නොතිබුණු බැවින් උන්වහන්සේ තමන් ගෝලයන් කැඳවා, ''සමූහයා කෙරෙහි අනුකම්පා ඇත්තෙමි, මක්නිසාද ඔව්හු දැනට තුන් දවසක් මා ළඟ සිටිති, ඔවුන්ට කන්ට කිසිවක් නැත. ඔවුන් තමුන්ගේ ගෙවලට නිරාහාරයෙන් යන්ට හැරියෙම් නම් ඔවුන් මාර්ගයේදී කලාන්තවෙනවා ඇත.'' නමුත් ගෝලයන් ළඟ තිබූ රෝටි සහ මාළු ස්වල්පයට උන්වහන්සේ ආශිර්වාදකොට, සියළු මනුෂ්‍යයන්ගේ කුස ගින්න නිවා දැමූසේක. තවත් කූඩ සතක් ඉතිරිව ද තිබුණෝය. මාර්ක් 8:1-10

8) මේ මුළු විශ්වය මවා පාලනය කරන මහෝත්තම සමිඳුන් ඔබට යේසුස්වහන්සේ තුළින් අනාවරණය වන සේක. ඔබ යේසුස් වහන්සේ අඳුනාගත් කල, මැවුම්කරුතුමන් ඔබ හඳුනාගත්සේක.

9) යේසුස්වහන්සේ නිතර නිතර බයිබලයෙන් උපුටා ගෙන ප්‍රකාශකළේ එය දේව වචනය බැවිනි.

10) යේසුස්වහන්සේගේ ශීල ධර්මය

''එබැවින් මනුෂ්‍යයන් විසින් නුඹලාට යමක් යමක් කරනවාට නුඹලා කැමතිද, නුඹලාත් එසේම ඔවුන්ට කරන්න. ව්‍යවස්ථාවත් අනාගත වාක්‍යයත් මේය.'' මතෙව් 7:12

''නුමුත් මම නුඹලාට කියමි: නපුරු අය සමග පොරට නොසිටින්න. යමෙක් නුඹේ දකුණු කම්මුලට ගැසී නම් ඔහුට අනික් කම්මුලද හරවන්න.'' යමෙක් එක හැතැප්මක් යන්ට නුඹට බලාත්කාරකෙරේද, ඔහු සමග හැතැප්ම දෙකක් යන්න. නුඹේ අසල්වාසියාට ප්‍රේමකරව, නුඹේ සතුරාට වෛරකරවයි කී බව

නුඹලා අසා තිබේ. නුමුත් මම නුඹලාට කියමි; නුඹලාගේ සතුරන්ට ප්‍රේම කරන්න, නුමලාට පීඩාකරන්නන් උදෙසා යාච්ඥකරන්න. මෙසේ නුඹලා ස්වර්ගයෙහි සිටින නුඹලාගේ පියාණන්වහන්සේගේ පුත්‍රයෝ වන්නෝය. එබැවින් නුඹලාගේ ස්වර්ගීය පියාණන්වහන්සේ සම්පූර්ණව සිටින්නාක්මෙන් නුඹලාත් සම්පූර්ණව සිටින්න.'' මතෙව් 5:39,41,43,44,45,48

''නුමුත් නුඹ දන්දෙන කල්හි, නුඹේ දනය රහස්ව තිබෙන පිණිස, නුඹේ දකුණත කරන දෙය වමත නොදනීවා.'' මතෙව් 6:3

''මාගේ ආඥව නම් මා නුඹලාට ප්‍රේමකළාක්මෙන් නුඹලාත් එකිනෙකාට ප්‍රේමකරන්නය යනුය. යමෙක් තමාගේ මිත්‍රයන් උදෙසා තමාගේ ජීවිතය දීමට වඩා මහත් ප්‍රේමයක් කිසිවෙකුට නැත.'' යොහන් 15:12,13

''එසේම මනුෂ්‍යයන් විසින් නුඹලාගේ යහපත් ක්‍රියා දැක ස්වර්ගයෙහි සිටින නුඹලාගේ පියාණන්වහන්සේට ගෞරවකරන පිණිස නුඹලාගේ ආලෝකය ඔවුන් ඉදිරියේ බබළාවා.'' මතෙව් 5:16

''පොළොවෙහි නුඹලාට වස්තු රැස්කර නොතබන්න; එහිදී කාවෝද මළකඩද ඒවා නාස්තිකරති, සොරුද උමංකැන සොරාගනිති. නුමුත් ස්වර්ගයෙහි නුඹලාට වස්තු රැස්කර තබා ගන්න; එහිදී කාවෝවත් මලකඩවත් ඒවා නාස්ති නොකරති, සොරු උමංකැන සොරා නොගනිති. මක්නිසාද නුඹේ වස්තුව යම් තැනෙක්හිද නුඹේ සිතත් එතැන්හිම වන්නේය.'' මතෙව් 6:19,20,21

''නුඹලා විනිශ්වයකරනු නොලබන පිණිස විනිශ්වය නොකරන්න.'' මතෙව් 7:1

''මක්නිසාද ගහ ඒකේ එල වලින් ඇඳිනගනු ලැබේ. පොළොං වංශය, නපුරුව සිටින නුඹලා යහපත් දේ කෙසේ කියවුද? මක්නිසාද සිතේ පූර්ණකමෙන් මුඛය කථාකරයි. යහපත් මනුෂ්‍යයා තමාගේ යහපත් සම්පතින් යහපත් දේ පිටතට ගෙනෙන්නේය. නපුරු මනුෂ්‍යයා තමාගේ නපුරු සම්පතින් නපුරු දේ පිටතට ගෙනෙන්නේය. තවද මනුෂ්‍යයන් කියන්නාවූ සියලු නිශ්ඵල වචන ගැන විනිශ්වය දවසේදී උත්තරදෙන්ට වෙන්නේයයි නුඹලාට කියමි. මක්නිසාද නුඹේ වචනවලින් නුඹ නිදෙස්කරනු ලබන්නෙහිය, නුඹේ වචනවලින් නුඹ වදරට පත්කරනු ලබන්නෙහියයි කීසේක.'' මතෙව් 12:33,35,36,37

යේසුස්වහන්සේ තම ශීල ධර්මයේ පිහිටා සිටිසේක. යේසුස් වහන්සේට දැඩි හිංසා පීඩා හා අපහාසද කරමින් කුරුසිය මත ඇණ ගසා මරුමුවට පත් කරන වේලෙහිදි උන්වහන්සේ ඔවුන්ට සමාව භජනය කරමින්, මෙසේ කීසේක. ''පියාණෙනි, ඔවුන්ට කමාවුව මැනව; මක්නිසාද ඔවුන් කරන්නේ මොකද කියා ඔව්හු නොදනිතියි කීසේක.'' ලූක් 23:34

11) උන්වහන්සේ ඉතා යටහත් පහත් ලෙස තම ශ්‍රාවකයින්ගේ පාද සෝද මෙසේ කීසේක. ''ඉඳින් ස්වාමිද ආචාර්යද වූ මම, නුඹලාගේ පාද සේදීම් නම්, නුඹලා

විසින් එකිනෙකාගේ පාද සේදිය යුතුය. මක්නිසාද මා නුඹලාට කළ ලෙස, නුඹලාත් කරන පිණිස නුඹලාට ආදර්ශයක් දුනිමි.'' යොහන් 13:14,15 තවද ඕනෑම තරාතිරමක තැනැත්තෙකුට තමා වෙත එන්නයයි කියමින් මෙසේ වදාළසේක.

''වෙහෙසවෙන්නාවූ, බර උසුලන්නාවූ සියල්ලෙනි, මා වෙතට එන්න, මම නුඹලාට සහනය දෙමි. මා සිතින් මෘදුව යටත්ව සිටින බැවින්, මාගේ වියගහ නුඹලා පිටට ගෙන, මාගෙන් ඉගෙනගන්න. එවිට නුඹලාගේ ආත්මවලට සහනය ලැබෙන්නේය. මක්නිසාද මාගේ වියගහ පහසුය. මගේ බරද සැහැල්ලුයයි කීසේක.'' මතෙව් 11:28,29,30

යේසුස්වහන්සේ කුඩා දරුවන්ට පවා තමාට සමීපවන්ට ආරාධනා කර වඩාගෙන, ඔවුන්ට ආශිර්වාද කළසේක. මාර්ක් 10:14,15

මේ හැසිරීමෙන් හා වචන වලින් උන්වහන්සේගේ මෘදුකම හා නිහතමානිකම ඉතා පැහැදිලිව පෙනේ.

12) මේ ලොව සිටි අය අතරින් මැරුණු පසු, මරු පරදා මරණින් ජයගෙන, ශාරීරික වශයෙන් නැවත නැගිටි එකම එක තැනැත්තාය. දැන් උන්වහන්සේ ජීවමානව වැඩ සිටින සේක. මරණින් නැවත නැගිටීම, තම විද්‍යානුකූල ආභාශය නිසා විශ්වාස කරන්නට අපොහොසත්වූ ඇතැම් දර්ශනිකයින්, යේසුස් වහන්සේගේ නැවත නැගිටීමේ සාධක පිරික්ෂ බලා එය සැබෑවක් යයි පැහැදි තිබේ. බ්‍රිතාන්‍ය නීතිඥයෙකු වන ෆ්‍රැන්ක් මොරිසන්, අමෙරිකානු දර්ශනිකයෙකු වන ලූ වොලස්ද, බ්‍රිතාන්‍ය දර්ශනිකයන් වන සී. ඊ. එම්. ජොඩ්, සී. එස්. ලුවිස්, මැල්කම් මගරිජ් හා රුසියන් ගත්කරුවෙකු වන ලියෝ ටෝල්ස්ටෝයි හොඳ උදහරණය. යේසුස්වහන්සේගේ මරණින් පසු භය බිරාන්තවූ ගෝලයෝ, කිසිම මතු බලාපොරොත්තුවක් නැතිව දොර ජනේල් අගුල්ලා සැඟවී සිටි අතර, ඔවුන් පුදුමයට පත්කරමින් තුන්වෙනිදා උදේ යේසුස්වහන්සේ ඔවුන් ඉදිරියෙහි පෙනීසිටිසේක. වසා ඇති දොරවල් බිත්ති හරහා උන්වහන්සේට ගමන් කරන්නට හැකිවිය. මෙය නැවත නැගිටීමේ ශරීරයේ ලක්‍ෂණයකි. එකල මේ පිරිස අතර තෝමස් නම් ගෝලයා සිටියේ නැත. ඔහුට මේ පුවත කී කල එය විශ්වාස නොකළේය. ''මමම උන්වහන්සේ, ඇසින් දැක අතින් ස්පර්ශ කරන තුරු, ඒ උන්වහන්සේමයයි විශ්වාස නොකරමි'' කීය. ඊට පසු දිනක තෝමස්ද ඔවුන් සමග සිටි වේලේ, යේසුස්වහන්සේ ඔවුන් ඉදිරියෙහි පෙනීසිටිසේක. තෝමස් අමතා, ඔහුට මෙසේ කීසේක.

'' නුඹේ ඇඟිල්ල මෙහි දිගුකොට, මාගේ අත් බලන්න; නුඹේ අත් දිගුකොට, මාගේ ඇළයෙහි බහාලන්න. අවිශ්වාස නොකොට, විශ්වාසකරන්නැයි කීසේක.'' යොහන් 20: 27

''තෝමස් උත්තර දෙමින්: මාගේ ස්වාමීනි, මාගේ දෙවියනියි උන්වහන්සේට කීවේය.'' යොහන් 20:28

ඊට පසුවද තවත් කීප දෙනෙකුට වෙන් වෙන් වශයෙන් පෙනුනුසේක. ඔවුන් සමග කෑමද වැළඳූසේක. මෙයින් එතුමන් හොල්මනක් නොවන බව ඉතා පැහැදිලිය. තවද එක්වර 500 ක් පමණ පිරිසකට උන්වහන්සේ පෙනුනුසේක.

දින 40 ක අවසානයේදී 120 දෙනෙකු ඔලීව කන්ද මුදුනට ගෙනගොස් ඔවුන්ට මහා පොරොන්දුවක් හා විධානයක් දී ඔවුන්ගේ ඇස් ඉදිරියේ ඉහලට එසවී ස්වර්ගයට නැංගේය. "නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණිකල නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදයෙහිද සමාරියෙහිද පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුයයි කීසේක." ක්‍රියා 1:8

"යේසුස්වහන්සේ ඔවුන් ළඟට ඇවිත් කථාකොට: ස්වර්ගයෙහිද පොළොවෙහිද සියළු බලය මට දී තිබේ. එබැවින් නුඹලා ගොස්, සියලු ජාතීන් ගෝලයන් කරන්න, පියාණන්ගෙත් පුත්‍රයාණන්ගෙත් ශුද්ධාත්මයාණන්ගෙත් නාමයට ඔවුන් බව්තීස්මකරන්න. මා විසින් නුඹලාට අණකළ සියල්ලම පවත්වන්ට ඔවුන්ට උගන්වන්න. මමද ලෝකාන්තිමය දක්වා සෑම කල්හිම නුඹලා සමග සිටිමියි කීසේක." මතෙව් 28:18-20

13) යේසුස්වහන්සේ සර්වඥණ බැවින් සියල්ල දැන සිටි සේක. එවක සිටි ආගමික නායකයන්ගේ චින්තන පවා උන්වහන්සේ දැන සිටිසේක. තවද, තම ශ්‍රාවකයින්ගෙන් කෙනෙකු වන ද්‍රෝහී යූදස් උන්වහන්සේ පාවා දීමට, කුට උපක්‍රමයක් යොදන බව යේසුස්වහන්සේ දැන සිටි සේක. සියලු මිනිසුන් තුළ තිබුණු ගතිගුණ මොනවට දැන සිටිසේක.

14) මැවුම්කරුතුමන්ට පමණක් පිදිය යුතු වන්දනා මාන, මිනිසුන් තමන්ට පුදකළ විට, උන්වහන්සේ පිළිගත්සේක. එබැවින් උන්වහන්සේද මැවුම්කරුතුමන් බව ඉතා පැහැදිලිය. මන්ද, එසේ නැතහොත් එය පිළිගැනිම දේව අපහාසකි.

15) යේසුස්වහන්සේ පාප රහිත නිර්මල නික්ලේසි ජීවිතයක් ගතකළ නමුත්, ඉතා දුක්ඛිත නින්දිත අන්දමකින් එද පෝරකයේ මැරුම් කෑ සේක.



## ඉතින් උන්වහන්සේ දුක්විද මැරුණේ කවුරුන්ගේ අකුසල් නිසා ද ?

එතුමාට කිසිත් පාප මලක්වත් නොතිබුනු හෙයින් ඒ දුක වින්දේ සෙසු අයගේ එල විපාක වශයෙන්ය. ඒ කියන්නේ ඔබත් මාත් උදෙසාය. යේසුස් වහන්සේ පුදුම උපතකින් මෙලොව වැඩම කරන්ට පෙර ස්වර්ගයෙහි පියාණන් හා ශුද්ධාත්මයාණන් සමග මූලාරම්භයට පෙර වැඩ සිටි සේක. කාලය පටන්ගත්තේ, උන්වහන්සේගේ මැවීමක් වශයෙනි. එබැවින් ඉතිහාසයක්ද ඇත. මේ කල්පයට, කෙළවරක් ඇත. එය නියම කරන්නේ පියාණන්වහන්සේය. මේ මුළු විශ්ව මණ්ඩලයේ ඇති සියලු ලෝකවල් මැව්වේ යේසුස්වහන්සේ තුළින්ය.



## උන්වහන්සේ පාප රහිත සර්වබලධාරී තැනැත්තේ නම් මිනිසුන්ට උන්වහන්සේව මරන්ට ඉඩ දුන්නේ මන් ද ?

උන්වහන්සේ මෙලොවට වැඩම කළේ මේ සඳහාය. එනම් ලෝ සතාගේද, ඔබේ හා මගේ ගැළවීම පිණිස, තම ජීවිතය පව් අහෝසිකරන යාගයක් කොට පූජා කරන පිණිසය. යේසුස්වහන්සේ මරණයට යෑමේ ගමන වැලැක්වීමට තම ගෝලයින්ද ඇවිටිලි කළහ. යක්ෂයාද උන්වහන්සේව පරීක්‍ෂා කරමින්, මේ තරම් අධික දුකකට පත්නොවී, උන්වහන්සේට මුළු ලෝ සතා බාර දෙන්නට නම්, ඔහුට වන්දනා මාන කරන්නැයි කියා සිටියේය. මේ ඉල්ලීම් සියල්ල උන්වහන්සේ ප්‍රතික්ෂේප කළසේක. උන්වහන්සේ පැමිණි මහඟු කාර්යභාරය කිරීමේ අධිෂ්ඨානයේ නොසැලී සිටීසේක. මේ සියල්ලට හේතුව මනුෂ්‍ය වර්ගයා චේතනාවේ, වචනයේ, ක්‍රියාවේ, අකුසල් වලට එල විපාකයන් ගෙවිය යුතු සර්ව සාධාරණ සත්‍යයයි. එය මැවුම්කරුතුමන්ගේ ධර්මිෂ්ඨ විනිශ්චයේ නියමයයි. එබැවින් යේසුස්වහන්සේ ජීවිත පූජාවෙන් ඒ ධර්මිෂ්ඨ විනිශ්චය ඉෂ්ඨකළසේක. එසේ කළේ ඔබට ඇති උන්වහන්සේගේ අප්‍රමාණ ආදරය නිසයි. ඔබට මැවුම්කරුතුමාණන් සමග සමගි වීමට හා මිත්‍ර වීමට ඇති එකම එක මාර්ගයයි.

යේසුස්වහන්සේගේ විරුද්ධවාදීන් පැවරූ නඩු විභාග වලදී හෙරොද් රජතුමා ද පිලාත් ආණ්ඩුකාරතුමන්ද උන්වහන්සේ නිවැරදිකරු යැයි ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළහ. පිලාත් ආණ්ඩුකාරතුමා යේසුස්වහන්සේ නිවැරදි බැවින්, නිදහස් කර යවන අටියෙන් කස පහර 39 ගස්සවා නිදහස්කර යවමියි කියා ඒ දඬුවමද උන්වහන්සේට දෙන ලදී. ඒ කස, හම් පටිවල අග යකඩ ඇණ වලින් යුක්ත කසවිය. ඒ කසපහරින් ඇඟ සූරාගෙන යයි. මේ උන්වහන්සේගේ ඇඟ පුරාම ඉරී ගියේය. ලේ වැගිරෙන්නද පටන් ගතී. එසේ උන්වහන්සේ දුක් වින්දේ අපට සුවය ප්‍රදාන කරන පිණිසය. මන්ද උන්වහන්සේ ඒ ලැබූ තුවාල වලින් අපට සුවය තිබේ. තමා මරණයට පත් කරන කුරුසිය තමා කර මතම යේසුස්වහන්සේ රැගෙනගියසේක. උන්වහන්සේගේ අත්ද, පාද ද සිදුරු කර ඇණගැසූ ඇණ වලින් උන්වහන්සේ එල්ලී සිටිසේක. එය ඉතා දීර්ඝ කාලීන අධිවේදනා සහිත මරණයකි. මේ සියලු ශාරීරික වේදනාවලට වඩා උන්වහන්සේ අත්දුටු ගාවිනාව නම්, යේසුස්වහන්සේ මූලාරම්භයට පෙර සෑමවිටම, මොහොතින් මොහොත පියාණන්වහන්සේට සමීපව සම්බන්ධව ඒකත්වයෙන් සිටි නමුත් යේසුස්වහන්සේ ලෝ සතාගේ පාපය හා අකුසල් තමා පිට ගත් කල, අතිශුද්ධ පියාණන්වහන්සේට තම සඳුරණියාණන් වුව ද ප්‍රතික්ෂේප කරන්ට සිදුවීමය. මේ නිසා යේසුස්වහන්සේද ගාවිනාවෙන් මෙස් හැඬූසේක. ''මාගේ සමිඳුනි, මාගේ සමිඳුනි ඔබ මා අත්හැරියේ මක්නිසාද'' ඒ ගාවිනාව හා ත්‍රාසය, ඔබට හා මට කිසි දිනෙක වටහා ගන්න නුපුළුවන. ඔබට පාප සමාව අත්පත් කරගැනීමට පුළුවන් වන පිණිසයි යේසුස්වහන්සේ ඔබේ අකුසල්වල එල

විපාකය වශයෙන් මැරුණේ. ජීවිතය පවතින්නේ ලේ තුළ ය. යේසුස්වහන්සේගේ ජීව රුධිරය වැගුරුණේ අපේ සිත් සතන් කිළුටින් සෝද හැරීමටය.

17) ඕනෑම කෙනෙකුට ඔබ වෙනුවෙන් පව්නසන යාගයක් ලෙස පූජා වීමට නොහැකිය. මන්ද, එසේ කළහැක්කේ අබමල් රේණුවක්වත් පාප මලක් නැති තැනැත්තෙකුටය. යේසුස්වහන්සේ හැර පාප මලක් නැති අන් කිසිවෙකු නැත. යේසුස්වහන්සේ සාමාන්‍ය මනුෂ්‍යයෙකු නොව, මාංශවත්වූ මැවුම්කරු බැවින්, උන්වහන්සේම, පාප රහිත, නිර්මල ලෙස ගත කළ ජීවිතය ඔබ උදෙසා කුරුසිය මත පූජා කළසේක.

18) ආදී අනාගතවක්තෘවරු මෙසියස්වහන්සේ නම් ගැලවුම්කරුතුමෙකු පැමිණෙන බව දිවස්වැකියේ කියා තිබුනී. යේසුස්වහන්සේ පැමිණි කල, ඒ මෙසියස්වහන්සේ තමා බව, යේසුස්වහන්සේ තරයේ කියා සිටිසේක.

ඔබ යේසුස් වහන්සේගේ ජීවිත කථාව කියවීමට පසු, උන්වහන්සේගේ අප්‍රමාණ ආදරය, කරුණාව හා උතුම් උගැන්වීම දුටු කල, මැවුම්කරු සමිඳුන්ගේ ඉමහත් ආදරයද ගැන ඔබට අවබෝධයක් ඇතිවේ. යේසුස්වහන්සේ තම ජීවිතය හා චරිතය පූජා කරමින් ඔබට ප්‍රදනය කරන දයා කරුණාව ගෙනහැර දැක්වූ සේක.

##  ඔබ උන්වහන්සේ ගැන සිතන්නේ කුමක් ද ?

උන්වහන්සේ බොරු කාරයෙක්ද? මුළු ලොවම මුලා කළ සේක්ද? නැතහොත් මානසික රෝගියෙක්ද? නැතහොත් උන්වහන්සේම කියා සිටි ආකාරයට ලෝවාසීන්ගේ මිදුම්කරුතුමාද? ලෝ මැවුම්කරු සමිඳුන්ද? යේසුස්වහන්සේ ගතකළ නිකලෙස් පිවිතුරු ජීවිතයද, හා සෙසු අයගේ ජීවිතද එද පිවිතුරු කළ ලෙසම අදත් කෝටි සංඛ්‍යාත ජනයන් තුළ කිරීමෙන් දක්වන්නේ, තමාම ගැන උන්වහන්සේගේ පැහැදීම නිවැරදි බවය. උන්වහන්සේ කියන දේ යථාර්ථය බවයි. යේසුස් වහන්සේ ගැන ඔබ ගන්නා නිගමනය ඔබේ මුළු ජීවිතයද ඔබේ සදාතනික ඉරණමද, හැඩගසනු ඇත.

උන්වහන්සේ බොරුකරුවෙකු නැතහොත් මානසික රෝගියකු නොවන්නේ යයි ඔබට පැහැදී තිබේ නම්, උන්වහන්සේ තමා ගැන කියා සිටි තැනැත්තේම යයි, සත්‍යවාදී තැනැත්තෙකු යයි පිළිගත යුතුමය. උන්වහන්සේ තමා ගැන කියන්නේ තමා මැවුම්කාර සමිඳුන් යයි කියාය.

උන්වහන්සේ බොරුකරුවෙකු නොවන බැවින් උන්වහන්සේ මැවුම්කරු සමිඳුන්ම විය යුතුයි.



## මෙලොවට පැමිණි යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අති විශිෂ්ඨ පූජාව වීම පිණිස මෙහි වැඩියේ මන් ද ?

මැවුම්කාර සමිඳුන් සර්වසම්පූර්ණය, නිර්මලය. අපද ඒ ස්වරූපයට සමානව ජීවත් විය යුතුය. එහෙත් එය අපට කළ නොහැකි දෙයකි. අපේ මනුෂ්‍යය හීනදීනතාවය නිසා ඒ ස්වභාවයට කිට්ටු විය නොහැකිය. එබැවින් අපට උන්වහන්සේ ළඟට පැමිණිය නොහැකිය. උන්වහන්සේ හා අප අතර ඇති පරතරය අපට කොහෙත්ම තරණය කළ නොහැකිය. එසේ කිරීමට ඇති එකම මාර්ගය හෙවත් පාලම යේසුස් වහන්සේ වන සේක. උන්වහන්සේ තම නිර්මල ජීවිතය පූජා කරමින්, එම පාලම හෙවත් මාර්ගය වූ සේක. ''මාර්ගයද, සත්‍යයද, ජීවනයද මම වෙමි; මා මඟින් මිස කිසිවෙක් පියාණන් වහන්සේ වෙත නොපැමිණෙන්නෝය.'' යේසුස් වහන්සේ වදාලසේක. යොහන් 14:6. ඊට පිටතින් වන අන් සෑම උත්සාහයක්ම නිෂ්ඵලවී අසාර්ථක වනු ඇත. ඇතැම් රටවල වනාන්තරයේ හා කඳු බෑවුම් වල අවුරුදු තිහ හතලිහක් මුළුල්ලේ භාවනා කරමින් මැවුම්කරු සමිඳුන් සොයන තවුසන් සිටින මුත් ඔවුන් කවුරුන් නමුත් ඒ උත්සාහයෙන් තවමත් සමත්ව නැත.


යේසුස්වහන්සේ තම ජීවන හුස්ම හෙළුවේ "සමාප්තයි'' කියා ජය හඬ නගමිනි. ඔබේ ද, ලෝසතාගේ ද, සියලු අකුසල් වල ඵල විපාකය උන්වහන්සේ ගෙවා අහෝසි කළසේක. එමනිසා ඔබටත් අන් කිසිවෙකුටවත් ගෙවන්න තව කිසිවක් නැත.

ඔබ උපන්නේ අකුසල් කිරීමේ ගතිය සහිතවය. ඔබ අකුසල් කිරීමට ඇබ්බැහිවී සිටින්නේ ඔබ අන්ධකාරයේ රාජ්‍යය තුළ පවතින බැවිනි. ඔබේ අකුසල් වසා ගන්නට ඔබට නොහැකිය. රත්තරන් මකන්නාක් මෙන් ඔබේ චරිතය ඔබටම මකාගත නොහැකිය.

බයිබලයේ රෝම පොතේ පාවුල්තුමා අපේ ස්වභාවය ගැන මෙසේ කියා තිබේ. අප තුළ ශීල ධර්මයට විරුද්ධ කැරළිකාර කමක් ඇත. අප කොපමණ ශීලය දැන සිටියත් අප හරි වැරදි දන්නවා පමණය. හරිදේ කිරීමටවත් වැරදිදේ නොකිරීමටවත් ශක්තිය නැත. අප ශීලය ධර්මය දන්නා තරමින්ම ඊට විරුද්ධවීම අපේ ස්වභාවික ගතියයි. මෙයට බයිබලය කියන්නේ අපේ පව්වූ බවය. අපේ ස්වභාවය, මනුෂ්‍යත්වයෙන් හීන දීන වී, අපටම අපේ වේගයන් අපට වාව ගන්ට බැරිය. එම නිසා අපෙන් සිදුවන්නේ වැරදිදේමය. පාවුල්තුමා එය මෙසේ පැහැදිලිව කියයි. ''මා හොඳ කරන්නට දැන සිටින නුමුත් මට එය කිරීමට ශක්තියක් නැත. මම නරකදේ නොකරන්ට ඉටා ගත්තත් මා අතින් සිදුවන්නේ නරක දේමය. ඉතින් මා තුළ මේ සටටණය නිතරම පවතී. අහෝ මෙයින් මුදගන්නේ කවරහු ද? යේසුස්වහන්සේට ස්තුතිවේවා උන්වහන්සේ පාපිෂ්ඨ ස්වභාවයෙන් මා මුදන සේක.''

නමුත් ඔබට තිබෙන ශුභාරංචිය නම්, යේසුස්වහන්සේ මරු පරදා නිරය බිඳ, යක්ෂයා පරාජය කොට මරණින් නැගිට ජීවමානව සිටින බවයි. ශුද්ධාත්ම

බලයෙන් යේසුස්වහන්සේ නැවත සප්ප්‍රාණිකවී මරණින් නැගිට්ට සේක. එම ශුද්ධාත්මයාණන්ගේ බලයෙන්, ඔබටද සියලු රැහැන්වලින් මිදී අකුසල් වල ආධිපත්‍යයෙන් නිවහල් වීමට පුළුවන. ඔබ තව දුරටත් එම අකුසල් මකා ගැනීමට වෙර දැරිය යුතු නැත. මැවුම්කාර සමිඳුන් සතුටු කරන, ජයෙන් යුතු, ජීවිතයක් ගත කිරීමට ඔබට දැන් නිවහල් විය හැකිය. යේසුස්වහන්සේ මෙලොව වැඩියේ කැඩුනු බිඳුනු සිත් ඇත්තන් සුව කරනු පිණිසය. වරදට ඇබ්බැහිවූවන් මුදන්නටය. යේසුස්වහන්සේ තම ශුද්ධ ශරීරය මත දැරූ තුවාල වලින් ඔබට සුවය සහනය ලබා ගත හැකිය.



උන්වහන්සේ කෙරෙහි අදහා මියගිය හා ජීවතුන් අතර සිටින බැතිමතුන් තමා වෙත ඔසවාගෙන ස්වර්ගයට ගෙනයෑමට පෙරලා පැමිණෙන සේක. මේ දෙපක්ෂයටම කිසිදු නොදිරන අජරාමර ශරීරයක් උන්වහන්සේ සපයනු ඇත.

ඉහත සඳහන් ආශිර්වාදයන් ලබා ගන්නට නම්, හෝ උන්වහන්සේගේ රාජ්‍යය තුළට අලුත් උත්පාදනය තුළින් ඔබ බිහිවිය යුතුයි. මව්කුස ඇති බිළිඳකුට පිටත ලෝකයේ කිසියම් දෙයක් සන්නිවේදනය කළත් මේ ලෝකයට බිහිවන තුරු නොතේරෙන ලෙසම, ඔබද ආත්මික ලෝකයට අළුත් උත්පාදනයකින් බිහිවන තුරු ආත්මික සත්‍යතාවයන් ඔබට නොතේරේ. එකල ඔබට ඇතුලාන්ත ශාන්තිය සහ සැබෑ ප්‍රීතිය අත්වනු ඇත. මෙය ලෝකයෙන් ලැබෙන්නේ නැති අතර, ලබාගන්නටද නොහැකිය. යේසුස්වහන්සේට පමණක් එය ඔබට ප්‍රදානය කළ හැකිය.



## උන්වහන්සේ මා උදෙසා කළ මේ සියල්ල අත්පත් කරගෙන දේව දරුවෙක් වීමට මා විසින් කුමක් කළ යුතු ද ?

ඔබට කිරීමට ඇති දේ නම්, ඔබේ අකුසල් වලින් ඉවත්වී නොහොත් ආපසු හැරී, යේසුස් වහන්සේ ඔබේ අකුසල් සියල්ලම තමා මත දරාගෙන එහි විපාකය ගෙවා අහෝසිකළ බව විශ්වාස කිරීමයි. එකල මැවුම්කරු සමිඳුන් ඔබේ වරද අහෝසි කර දමා ඔබ නිවැරදිකරුවෙකු ලෙස පිළිගන්නා සේක. මැවුම්කරු සමිඳාණන්ගෙන් නිදහස්ව ජීවත්වූ තැනැත්තෙකු වශයෙන් සිටි ඔබ, දූන් උන්වහන්සේගෙන් යැපෙන්නෙකු ලෙස ජීවත්විය යුතුය. එසේ උන්වහන්සේට ඔබ තුළ පාලනය කරමින් ඔබ තුළ වැඩ සිටීමට ඉඩ දිය යුතුයි. මැවුම්කරු සමිඳුන් මුළුමනින්ම ධර්මිෂ්ඨ නමුත් යේසුස් වහන්සේ අපේ අකුසල් වල පල විපාකය දරාගෙන අහෝසි කළ නිසා ඔබ මත පැවතුනු සමිඳුන්ගේ විනිශ්චය හා දඬුවම දූන් ඉවත් කර තිබේ. එබැවින් විනිශ්චය දිනදී ඔබ දඬුවමට පත් නොකෙරේ. ධර්මිෂ්ඨ සමිඳුන්ගේ ස්වරූපයෙන් ඔබ හිනවී සිටින නිසා, ඔබට හිමි දඬුවම යේසුස් වහන්සේ මත පමුණුවාගත් නිසා, ඔබගේ දඬුවම අහෝසි වී ඇත. ඔබ දූන් අලුත් මනුෂ්‍යයෙක් වන්නෙහිය. ඔබ තුළ දූන් අළුත් අපේක්ෂාවන් හා අරමුණු ඇත. සමිඳුන් සතුටු කෙරෙන දයාන්විත ජීවිතයක් ගත කිරීම සඳහා, ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය ලබාගත හැකිය.

උසාවියේදී ඔබට වරදකරුවෙකු ලෙස දඬුවමක් වශයෙන් දඩයක් තීන්දුකොට එය නොගෙව්වොත් සිරගතවීමට නියම වූ කල, නම් නඩුකාරතුමා විනිශ්චය ආසනයෙන් බැස ඇවිත්, ඒ දඩයට සමාන චෙක්පතක් ලියා ඔබේ අතට දෙන්නේ නම්, එය අතට රැගෙන ගෙවා නිදහස්වී යන්නට පුළුවන. එය ප්‍රතික්ෂේප

කළහොත් ඔබට සිරගත වන්නට සිදුවෙයි. මෙයින් ඔබට පෙනෙන්නේ සමිඳුන් නොමිලයේ ප්‍රදානය කරන සමාව ඔබ පුද්ගලිකව පිළිගත යුතු බවයි. ඔබ එය පිළිගත්තෙහි නම් ඔබට සදාතන ජීවනය ලැබේ. ප්‍රතික්ෂේප කරන්නේ නම් සදාතන නිරයට යන්නට සිදුවෙයි.



## යේසුස්වහන්සේ අදහානොගෙන උන්වහන්සේ ප්‍රතික්ෂේප කළොත් මගේ ඉරණම කුමක් ද ?

ආදම් ඒව යන අප මුල් මව්පියන්ට නිගමනයක් ගැනීමට තිබුණු ලෙසම ඔබට දැන් නිගමනයක් ගැනීමට තිබේ. ඔබේ අකුසල් නිසා සමිඳුන් හා බිඳුනු සම්බන්ධය උන්වහන්සේගේ සිතට විශාල වේදනාවකි. "ඔබ මුළු ලෝකයම දිනාගත්තත් ඔබේ මුළු ආත්මයම විනාශයට පත්කර ගතහොත් ඔබට ඇති ලාභය කුමක්ද?" යේසුස්වහන්ස් කීසේක.

**ඔබට එක ජීවිතයක් ද එක් වරක් මරණය ද ඉන්පසු විනිශ්චය ද බැවින් මැරුණුපසු සත්‍යය දැනගැනීමට අපේක්ෂා කිරීම ප්‍රමාද වැඩිය**



## ඔබේ ජීවිතය අද කෙළවර වුවහොත් ඔබ පරලොව ගෙනයන්නේ කුමක් ද ?

පරලොව ගැන නොසලකන මේ ලෝකයේ දේවල් වලට තණ්හා සහගත අයට අවදනම් අඟවන පිණිස, යේසුස්වහන්සේ මේ උපමාව වදාළ සේක.

එක් ධනවතෙක් තමාගේ අස්වැන්න රැස්කර ගැනීමට අටුකොටු වඩා විශාල කරගෙන, 'එහි මාගේ සියලු ධාන්‍යයද බඩුද රැස්කර තබා - ප්‍රාණය නුඹට බොහෝ අවුරුදු ගණනකට හොඳවූ බොහෝ දේ රැස්කර තිබේ. පහසුගෙන කා බී ප්‍රීතියෙන් සිටපන්නැයි මාගේ ප්‍රාණයට කියමියි කීවේය. නුමුත් ස්වාමීන්වහන්සේ ඔහුට කථාකොට : අඥානය, අද රාත්‍රියේදී නුඹේ ප්‍රාණය නුඹෙන් අයකරනු ලැබේ. එවිට නුඹ සූදනම් කරගත් දේ කවරකුට වන්නේදැයි කීසේක. ස්වාමීන්වහන්සේ කෙරෙහි පොහොසත් නොවී, තමාටම වස්තු රැස්කර ගන්න අය ඒයාකාරයයි කීසේක." (ලූක් 12:19-21).

ඔබ මරණයට සූදානම්ද? මරණයෙන් මතු ඔබට සිදුවන්නේ කුමක්ද?

නිගමනයක් ගැනීමට කල් නොදමන්න. එසේ කිරීමේ මොහොත දැන්ය. ඔබ තීරණය ගත යුත්තේ අදයි.



## මෙතරම් පැහැදිලි සාධක තිබියදී, ඔබගේ මැවුම්කරු හා ගැළවුම්කරු වන යේසුස්වහන්සේ ප්‍රතික්ෂේප කළහොත් ඔබට සිදුවන්නේ කුමක් ද ?

ඊට බයිබලයේ උත්තර නම් නොඇදහිලිවන්තයන් විනිශ්චයෙන් පසු නිරාගින්නට හෙලනු ලැබීම ය. ''තවද මහත් සුදු සිංහාසනයක්ද එහි වැඩිහුන් තැනන්වහන්සේ ද දුටිමි. උන්වහන්සේගේ අභිමුඛයෙන් අහසත් පොළොවත් පලා ගියේය; ඒවාට ස්ථානයක් සම්භනූණේය. සමුද්‍රය එහි උන් මළවුන් පාවාදුන්නේය. පාතාලයත් එහි උන් මළවුන් පාවාදුන්හු ය. ඔවුන් එකිනෙකා තමාගේ ක්‍රියාලෙස විනිශ්චය කරනු ලැබුවෝය. මරණයත් පාතාලයත් ගිනිවලට හෙලන ලද්දේය. මෙය දෙවැනි මරණයය, එනම් ගිනිවිලය. යමෙකුගේ නම ජීවන පොතෙහි ලියා නැතිබව සම්භවීද ඔහු ගිනි විලට හෙළනු ලැබුවේය.'' එළිදරව් 20:11- 25

''නුමුත් භය ඇත්තන්ටත්, අවිශ්වාස කරන්නන්ටත් පිළිකුල්ව සිටින්නන්ටත්, මිනීමරන්නන්ටත්, වෙශ්‍යාකම් කරන්නන්ටත්, මායාකාරයන්ටත්, රූප වඳින්නන්ටත්, සියලු බොරුකාරයන්ටත්, ගින්නෙනුත් ගෙන්දගම්නුත් දැවෙන විළෙහි තමුන්ගේ කොටස වන්නේය; එය දෙවෙනි මරණයයි මට කීසේක.'' එළිදරව් 21:8

''පුත්‍රයාණන් කෙරෙහි අදහන්නාට සදාකාල ජීවනය ඇත; නුමුත් පුත්‍රයාණන්ට කීකරු නොවන්නා ජීවනය නොදක්නේය, ස්වාමීන්වහන්සේගේ උදහස ඔහු කෙරෙහි පවතියි.'' යොහන් 3:36

ඔබේ ජීවිතයේ ක්‍රියා තුළ උන්වහන්සේ සැබෑ බව ඔබට ප්‍රත්‍යක්ෂ කරදීමට යේසුස්වහන්සේට දැන් අවස්ථාව දෙන්න.

හිතවත් මිතුර, මිතුරිය, ඔබ දැන් ජීවත්වන්නේ ඔබටම කැමති අන්දමටය. නමුත් ඔබ ගමන් කරන්නේ සමිඳුන්ගෙන් බැහැරවය. විනාශමුඛයෙහිය. එහෙත් සමිඳුන් උන්වහන්සේගේ මහත් ආදරය හා දයා කරුණාව නිසා ඔබ ආපසු හැරී, ඔබේ අකුසල් වලින් ඉවත්වී, මුහුණට මුහුණ දෙන්න කියා ඉල්ලා සිටින සේක. ආපසු යොමුවීම නැතිනම් හැරීම කියන්නේ දුක්වීමවත් ආත්මතාපයෙන් පෙළී සිටීමවත් නොවේ. එහෙත් සමිඳුන් හා සමග ඇතිවන සම්බන්ධතාවයෙන් වරදට ද්වේශ කිරීමය. සමිඳුන් ඔබට ආදරය කරන සේක. එහෙත් ඔබේ අකුසල් වලට ද්වේශකරන සේක. ඔබේ අකුසල් කොපමණ බිහිසුනුද කිවහොත් එය අහෝසි කිරීමට යේසුස්වහන්සේගේ නිර්මල ජීවිතය පූජා කරන්නට සිදුවිය. යේසුස්වහන්සේ ඔබේ දඬුවම වින්ද සේක. ඔබේ මරණය වෙනුවට මැරුණු සේක. ඔබ උදෙසා උන්වහන්සේ සියල්ලම වැය කර තිබේ.

ඔබෙන් කිසිත් අය කර නැත. උන්වහන්සේගේ ගැලවීම නොමිලේ ත්‍යාගයක් ය.



## මෙතුමා ඔබ උදෙසා ස්වර්ගය හැර පැමිණ කළ ජීවිත පූජාව ඔබ ප්‍රතික්ෂේප කර උන්වහන්සේගේ සිත රිද්දනවා ද ?

නැතහොත් ඔබේ සිත වෙනස් කර සියලු වරදින් ඉවත්වී උන්වහන්සේ වෙනුවෙන් යොමු වෙනවාද? උන්වහන්සේට ඔබේ සිත හා ජීවිතය භාර දෙනවාද? අතිශුද්ධ පිරිසිදු මැවුම්කරුතුමන්ට අප්‍රසන්න වන සියලු වැරදි ඔබ ද්වේශ කරන්න. ඔබේ අකුසල් සියල්ල වැරදි බව පිළිගෙන, නැවත ඒවාට යොමුනොවෙන්න අධිෂ්ඨාන කරගන්න. ඔබ, උන්වහන්සේගේ ශුද්ධ වචනය අනුව ජීවත් වෙන්න අපේක්‍ෂා කළවිට, ඔබට පිවිතුරු, පාපයෙන් ජයග්‍රාහී ජීවිතයක් ගත කරන්ට උන්වහන්සේ පිහිට වන සේක. ඔබේ ජීවිත මාර්ගයෙන් සම්පූර්ණයෙන් ආපසු යොමුවීමක් කරන්න. ස්වාමීන්වහන්සේ ඔබ ආදරයෙන් පිළිගෙන සමාව දෙන්න බලා සිටින සේක. ඔබට දැන් අළුත් ජීවිත මාර්ගයක ගමන් කිරීමට පුළුවන. ඔබ වැනි එක තැනැත්තකු වුවද, මෙසේ ආපසු යොමු වූ විට ස්වර්ග රාජ්‍යයේ සියල්ලෝම ප්‍රීති වන්නෝය. ඔබේ අකුසල් වලින් ඉවත්වී යේසුස්වහන්සේට ඔබේ ජීවිතය කැප කරන්න. අතිශුද්ධ ධර්මිෂ්ඨ සමිඳුන් අප්‍රිය කරන ඔබේ අකුසල් වලට ද්වේශ කරන්න. ඔබ කළ අකුසල් වැරදි බව පිළිගන්න. එය අත්හැර නැවත නොකරන්නට තීරණය කරන්න.

ඔබ මෙසේ නිගමනය කර සමිඳුන්ගේ වචනයට කීකරුව ජීවත්වීමට කැමති වූ කල, ඔබේ දුර්වලකම් වලින් ජයගෙන ජීවත්වීමට උන්වහන්සේම ඔබට උදව් කරන සේක. ආපසු සමිඳුන් වෙත යොමුවෙන්න. උන්වහන්සේ ඔබ ආදරයෙන් පිළිගැනීමට සැරසී සිටින සේක. ඔබට සමාව දී, පිළිගැනීමට උන්වහන්සේ දෑස් යොමා බලා සිටින සේක.

ශුද්ධ වූ දේව වචනයේ අන්තිම පොතවන එළිදරව් පොතේ 3:19-20 යේසුස් වහන්සේ මෙසේ වදාල සේක.

"මා ආදරය කරන්නන්ට මම තරවටුකොට හැඩ ගසන්නෙමි. එබැවින් අවංක වන්න. ආපසු හැරී එන්න. බලන්න මම දොරළඟ සිට තට්ටු කරමි, යමෙකු මගේ හඬ අසා දොර හරින්නේ නම්, මම ඔහු තුළට පැමිණෙන්නෙමි. මම ඔහු සමග කෑම කන්නෙමි. ඔහුද මා සමග කන්නෙහිය."

ඔබේ හදවත නැමති දොරට යේසුස්වහන්සේ තට්ටුකරන සේක. උන්වහන්සේ ඔබට කිසි බලපෑමක් නොකරයි. උන්වහන්සේ බලහත්කාරයෙන් ඇතුල් නොවන සේක. නිගමනය ඇත්තේ ඔබ අතෙහිය. ඔබ තුළට වැඩම කර, ඔබේ හදවත උන්වහන්සේගේ මාළිගාව කරගැනීමට ඔබ දොර හැර, උන්වහන්සේට ආරාධනා කරන්න. ඔබේ හදවත දැඩිකරගෙන උන්වහන්සේට දුක්නොදෙන්න. උන්වහන්සේ ඔබ උදෙසා කළ ජීවිත පූජාව නිරපරාදයේ නොවේවා.!

හිතවත් මිතුර, යේසුස්වහන්සේ තුළින් පියාණන් වහන්සේ වෙතට එන්නට යේසුස්වහන්සේ ඔබ පවිත්‍ර කොට, උන්වහන්සේගේ ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් ඔබ පුරවනු ඇත. එම ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් ඔබ මෙහෙයවන කල, ඔබේ ආත්මාර්ථකාමී අදහස් උදහස් තවත් ඔබ ඉෂ්ඨ නොකරනු ඇත.

ඔබේ ජීවිතය තුළට යේසුස්වහන්සේට වැඩම කරන්නට අවස්ථාව දී, ඔබ අලුත උත්පාදනය වී, සමිඳුන්ගේ රාජ්‍යය තුළට උන්වහන්සේගේ දරුවෙකු සේ උත්පාදනය වෙන්නට ඔබ කැමති නම් මේ යාච්ඤාව අවංකව කියා සිටින්න. ඔබේ සිත ශුද්ධාත්මයාණන් වහන්සේට පිරික්සන්න ඉඩ දෙන්න.

''සමිඳුනි, මා පරීක්ෂාකර බලන්න. ඔබවහන්සේ මා ගැන හොඳාකාර දන්නා සේක. මා කරන සියල්ල ඔබවහන්සේට පෙනෙන සේක. මගේ සිතුවිලිද, ඔබවහන්සේ දන්නා සේක. මගේ සියලු ක්‍රියාද ඔබ වහන්සේ දන්නා සේක. ඔබවහන්සේ මා වටා වැඩ සිටින සේක. ඔබවහන්සේ මා ගැඹුරෙන් දන්නා සේක. මට ඔබෙන් පලායාමට නුපුළුවන. ඔබවහන්සේගෙන් මට සැඟවෙන්නට නොහැකිය. මගේ සෑම අවයවයක්ම ඔබවහන්සේ තැනූසේක. ඔබවහන්සේට ගෞරව කළ යුතු බැවින්, මම ඔබට ප්‍රශංසාකරමි. මා පරීක්ෂා කර බැලුව මැනව. මගේ සිතුවිලි පවා පරීක්ෂා කර බැලුව මැනව. මා තුළ කිසියම් කිලිටුවක් හෝ නපුරක් හෝ තිබේදැයි සොයා බැලුව මැනව. මා විසින් කරන ලද සෑම වරදක්ම මගේ මතකයට ගෙන දුන මැනව. ඔබවහන්සේ මට දන්වන සියලු වැරදි වලින් මම ඉවත් වෙමි. ඔබ වහන්සේගේ සමාව මම පිළිගනිමි. ඔබවහන්සේ මට දෙන නිදහස මම අත්පත් කරගන්නෙමි.''

ඔබේ මතකයට සමිඳුන් ගෙනෙන සියලුම දේ දැන් සටහන් කරන්න. ඔබේ මතකයට එන යම් දෙයක් වරදක්ද? නැද්දෝ කියා අනුමානයක් ඇත්නම්, ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබගේ මතකයට ගෙනෙන්නේ වරදක් යයි පිළිගෙන එය ප්‍රතික්ෂේප කරන්න. එය නැවත නොකිරීමට අධිෂ්ඨාන කරගන්න.

පහත සඳහන් අකුසල් ලැයිස්තුව කියවා ඔබ අතින් සිදුවූ සියල්ල සටහන් කරන්න. ඒවා එක එක ප්‍රතික්ෂේප කරන්න. ඒවා නැවතත් නොකිරීමට අධිෂ්ඨාන කරන්න.

සොරකම, වෛරය, මිනිමැරීම, කෝපවීම, අනියම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙකු සමග වාසය කිරීම, කාමයෙ වරදවා හැසිරීම, කැදරකම, ඊර්ෂ්‍යාව, වංචාව, මුසාව, ඕපාදූප කීම, උඩඟුකම, දබරකිරීම, පොරබැදීම, කාමයේ චේතනා, අපවිත්‍ර සිතුවිලි, දිව්රීම, අලසකම, සමාව නොදීම, බීමත්කම, කළයුතු දෙය අතපසු

කිරීම, වස්තු තණ්හාව, සූදුව, සාපකිරීම, අණවින, කොඩිවින කිරීම, අංජනම් බැලීම, මළගිය ඇත්තන් ගෙන්වීමට තැත් කිරීම, එවැනි තැන්වලට යෑම, දිෂ්ඨී වලට පත්වීම, රූපවන්දනාව, මිථ්‍යාමත දැරීම, කේන්දර හා ශාස්ත්‍ර බැලීම, දෙවිදේවතාවන් යැදීම, බලි තොවිල් වලට සහභාගිවීම, භාර ඔප්පු කිරීම, ලේවලින් අත්සන් කිරීම, මෝහණය වීම යක්ෂ බන්ධන, සූර යනාදිය පාවිච්චිය, භේදවීම්, දෙමාපියන්ට අකීකරුවීම, සිත් දූඩිකර ගැනීම, ඒක ලිංගික සේවනය, පරවේදනා කාමුබත්වය, අසභ්‍ය පොත්පත් චිත්‍ර හා කුඩු මත්ද්‍රව්‍ය පාවිච්චි කිරීම, දුම්පානය, මත්පැන් පානය, නීතිවිරෝධි දේ කිරීම, කැරළි ගැසීම, ලේ වැගිරීම, බොරු සාක්ෂි දීම, කලුකඩකාරකම්, ගිණිපොලියට දීම, එකට එක කිරීම, ළමා අපචාර, සූරාකෑම, නිසි වැටුප් නොදීම, විවාහ ගිවිසුම් කැඩීම, සැමියාට අකීකරුවීම, අඹුදරුවන්ට ආදරය නොකිරීම, වංචාකාර ජීවිත, අකුසල්වලට විපාක නැතැයි සිතීම, සෙසු අයට කරදර හිරිහැර කිරීම, ජාති කුල ආගම් භේද, ගබ්සා කිරීම, සියදිවි හානිකර ගැනීමට සිතීම, අසභ්‍ය විහිළු, අනුන් හෙලාදැකීම ආදියයි.

ඔබ මේ සියල්ලෙන් ඉවත්වී, සමිඳුන් වෙත ආපසු යොමුවී, සමාව ලබාගන්නට කැමති නම්, මෙවැනි යාච්ඤාවක් කියන්න.

"යේසුස් සමිඳුනි, මාගේ සියලු වැරදි වලින් මම ඉවත් වන්නෙමි. ඒ අකුසල් සියල්ල වැරදි බව පිළිගන්නෙමි. ඒවා නැවත නොකරන්න ඉටා ගන්නෙමි. මාගේ වැරදි සියල්ලට කමාවුව මැනව. මගේ අකුසල් සියල්ල ඔබවහන්සේගේ ශරීරය මත දරාගෙන ඒ විපාකය ගෙවා, ඒවා අහෝසි කිරීමට ඔබවහන්සේ ස්වර්ග රාජ්‍යයේ සිට මොලොවට පැමිණි බව මම විශ්වාස කරමි. එසේ අකුසල් අහෝසි කළ නිසා මට දැන් සමාව දුන් නිසා ඔබවහන්සේට ස්තුතියි. ඔබවහන්සේ මරු පරදා මරණින් නැගිට දැන් ජීවමානව සිටින්නේයයි මම විශ්වාස කරමි. මගේ ජීවිතය තුළට වඩින්න. මා තුළ වැඩ වාසය කරන්න. ඔබට ස්තුතියි. දැන් මගේ හදවත ඔබවහන්සේගේ මාළිගාව කොට, මගේ ජීවිතය පාලනය කරමින් මගේ හිමිකරු වශයෙන් ඔබවහන්සේ මගේ හදවතට පිළිගතිමි. අධර්මිෂ්ඨකමේ උපකරණයෙන් මගේ අවයවයන් පාවිච්චි කිරීම මම අත්හරිමි. මගේ මුලු සර්වාංගයම ඔබවහන්සේට පූජා කරමි. මින්මතු මම ඔබවහන්සේට කීකරු වන්නෙමි. මගේ මනස ඔබවහන්සේගේ උතුම් අදහස් වලින් පිරෙව්ව මැනව. සමිඳුනි මා තුළ ජීවත් වෙමින් ඔබවහන්සේගේ ජීවිතය ගතකළ මැනව. ඔබවහන්සේම මෙලොව සිටියදී කළ ක්‍රියා මා අතින්ම කරනු මැනව. ඔබවහන්සේගේ වචන මාගේ මුවින් කථාකළ මැනව. මා ඔබවහන්සේ සතුය. මා ඔබවහන්සේගේ දරුවකු කිරීම ගැන ස්තුතිය.''

ඔබ අවංකව මේ යාච්ඤුව කීවෙහි නම් ඔබේ අකුසල් අහෝසිවී ඔබේ සිත පවිත්‍රවී, ස්වාමීන්වහන්සේගේ සමාව ලබාගෙන, උන්වහන්සේ සමග සමාදන වී ඔබ දැන් දේව දරුවෙකුවූ නිසා තමාගේ නම යේසුස්වහන්සේගේ ජීවන

පොතේ සටහන් කර තිබේ. එබැවින් ඔබ විනිශ්චයට පත් නොකෙරේ. දැනටම අධ්‍යාත්මික මරණින් එතරවී, ජීවනයට පැමිණ තිබේ. දැන් ඔබ පවතින්නේ ආලෝකයේ රාජ්‍යයේය. නැවත අන්ධාකාරයේ කාරණා වලට කිසිම සම්බන්ධයක් ඇති කර නොගන්න.

ඔබේ අවංක සිතින් යේසුස්වහන්සේ ඔබේ හදවතට ආරාධනා කර පිළිගත් නිසා දැන් උන්වහන්සේගේ ජීවිතය ඔබ තුළ පවතියි. එනම් උන්වහන්සේගේ මරණෝත්ථාන ජීවිතයයි. දැන් ඔබ සමිඳුන්ගේ දරුවෙකුවේ. ශුද්ධාත්මයාණන් වහන්සේ තුළින්, යේසුස්වහන්සේ දැන් ඔබ තුළට වැඩ වාසය කරන සේක. මන්ද යොහන් 1:12,13 මෙසේ සඳහන්වේ.

'යේසුස් වහන්සේ තම ජීවිතයට පිළිගත් සියල්ලන්ට එනම් උන්වහන්සේගේ නාමය කෙරෙහි අදහන අයට දේව දරුවන් වීමේ බලය සමිඳුන් දුන් සේක.'' ඔව්හු ලෙයෙන්වත්, මාංසයේ කැමැත්තෙන්වත් මනුෂ්‍යන්ගේ කැමැත්තෙන්වත් නොව ස්වාමීන්වහන්සේගෙන් උපන්නෝය.

මැවුම්කරු සමිඳුන් දැන් ඔබේ ස්වර්ගීය පියාණෝය. දැන් ඔබට උන්වහන්සේ සමග කිට්ටු සම්බන්ධතාවයක් පැවැත්විය හැකිය. ඔබගේ නම යේසුස් වහන්සේගේ ජීවන පොතේ ලියා ඇත. එනිසා ඔබ විනිශ්චයට නොපැමිණ, දැන්ම ආධ්‍යාත්මික මරණයෙන් සදකාල ජීවනයට ඇතුලත්වී තිබේ.

ඔබේ අකුසල් සමිඳුන් අහෝසි කර, උන්වහන්සේගේ මතකයෙන් ද එය මකා දමා ඇත. දැන් ඔබට සමාව දී තිබේ. උන්වහන්සේ ඔබට සමාව දී තිබෙන බැවින්, ඔබත් ඔබට සමාව දෙන්න. ඔබ කිසිවිටෙක අකුසල් නොකළ තැනැත්තෙකු ලෙස සමිඳුන් ඔබ සලකනවා ඇත. යේසුස්වහන්සේගේ ජීවන පොතේ ඔබේ නම ලියා ඇත. ඔබ සදාතන ජීවය ලබා ඇත. ඔබේ මිලය ගෙවා ඔබ මුදාගෙන තිබේ. ඔබ උන්වහන්සේ සතුය. ඔබේ මිදීම නොහොත් ගැළවීම ඔබේ හැඟීම් මත පවතින්නේ නැත. එහෙත් දේව වචනයේ අධිකාරිය මතය.

ඔබ යමෙකුට වරදක් කර තිබේනම්, ගොස් එය නිවැරදි කරන්න. ඔබට සමිඳුන් සමාව දී ඇති ලෙසම ඔබට විරුද්ධව වැරදි කළ අයෙකුට සමාව දී, තවම පවතින තරහව ක්‍රෝධය, අමනාපය උන්වහන්සේට ඔබ සිත තුළින් ඉවත් කරන්න ඉඩ දෙන්න.

ඔබ යේසුස් වහන්සේට ඔබේ හදවත තුළ වැඩ වාසය කිරීමට ආරාධනය කර තිබෙන හෙයින්, උන්වහන්සේ එය පිවිතුරු කර එහි හිමිකරුවීමට සතුටුය. ඔබේ හදවත ගෙදරක් ලෙස සිතන්න.

එහි විසිත්ත කාමරයට කැඳවා ගෙන යන්න. උන්වහන්සේ එහි නිතර පැමිණෙන ආගන්තුකයා වීමට සතුටුය. එබැවින් ඔබ උන්වහන්සේ සමග නිතිපතා කතාබස් කිරීමෙන් කාලය ගතකරන්න. දිනපතා අනෙකුත් කටයුතු වලට යෙදන්න ප්‍රථම, උදෑසන මෙසේ කිරීමට යෝග්‍යය. ඔබට උන්වහන්සේ පැමිණ තිබෙනවායයි අමතක වූවත්, උන්වහන්සේ ඔබ එනතුරු බලා සිටින සේක.

අයදිනවා යනුවෙන් අදහස් කරන්නේ ඔබේ වචන වලින් උන්වහන්සේට කථාකිරීමයි. දිනපතා ඔබේ අවශ්‍යතාවයන් උන්වහන්සේට කියා සිට, උන්වහන්සේ ඒවා සපුරාලන බව විශ්වාස කරන්න. ඔබ කනස්සල්ලෙන් පීඩා විඳින්නේ නම්, ඒ සියලු සිතේ බර උන්වහන්සේට සම්පූර්ණයෙන් භාර කරන්න. උන්වහන්සේ ඔබ ගැන ඉතා ආදරයෙන් සලකන බැවින්, ඒ සියල්ල ඔබ වෙනුවෙන් දරාගන්නා සේක. (1 පේතෘස් 5:7) උන්වහන්සේට ඔබේ ආදරය ගැන නිතර කියමින් ඔබේ සිත තුළ උන්වහන්සේට ප්‍රශංසා කරන්න. උන්වහන්සේ ඔබේ ආදර ප්‍රශංසාවට ඉතා ප්‍රිය කරන සේක.

පුස්තකාලයට උන්වහන්සේ කැඳවාගෙන යන්න. එනම් ඔබේ මනස එහි ඇත. ඔබේ සිතුවිලි විමසා බලන්නට උන්වහන්සේට ඉඩ හරින්න. එහි ඇති පොත් බයිබලයේ පොත් වලින් මාරුකරන්නට උන්වහන්සේට ඉඩ දෙන්න. උන්වහන්සේගේ වචනය මෙනෙහි කරන්න. එහි ඇති උන්වහන්සේගේ චරිතය කෙරෙහි ඔබේ අවධානය යොමු කරන්න. ඔබේ සිතට ඇතුල්වෙන සෑම චේතනාවක්ම යේසුස්වහන්සේට අවනත කරන්න.

ඔබේ කෑම කාමරයට උන්වහන්සේව කැඳවා ගෙන යන්න. ඔබ පෙර අනුභව කළ ආහාර වෙනුවට දේව වචනයෙන් අලුත් පෝෂණය අනුභව කිරීමට ආශා කරන්න. දිනපතා බයිබලයේ කොටසක් කියවන්න. ශුභාරංචි පොතකින් පටන්ගන්න. ඊට පසු අළුත් ගිවිසුමක් ලබා ගෙන ක්‍රියා පොත කියවන්න. ඊට පසු පාවුල් තුමාගේ යැවුම් පත්‍ර කියවන්න. එපීස යැවුම් පත්‍රයෙන් පටන්ගැනීම සුදුසුයි.

බයිබල් කොටස කියවීමට පෙර, යේසුස්වහන්සේ ගැන ඔබට අනාවරණය කරන්නැයි කියාද, උන්වහන්සේට කීකරු වන්නේ කෙසේද කියා අයදින්න. ඉතා කුඩා කොටසක් වූවත් දිනපතා කියවන්න. එය මෙනෙහි කරමින් තමාට එයින් යමක් කා වදින තුරු, එය රඳවා ගන්න. කියවන අතර කොටසින් මේ ප්‍රශ්ණ සළකා බලන්න.

- ★ මගේ ජීවිතයේ තිබෙන, පසුතැවිලි හෝ සමාව ඉල්ලන්න තිබෙන පාපයක් හෝ වරදක් තිබේ ද? මෙය දුටු විගසම පසුතැවිලි වී සමාව ඉල්ලන්න.
- ★ මට ලබාගත හැකි අළුත් ඉගැන්වීමක් හෝ වෙනස් කිරීමට තිබෙන අදහස් හෝ තිබේද?

* මට යේසුස්වහන්සේ ගැන ඉගෙනගන්න දෙයක් තිබේද? ස්වාමීන්වහන්සේ වගේ වීමට ශුද්ධාත්ම බලය ඉල්ලන්න.
* මට කීකරුවීම සඳහා ආඥා මොනවාද? උන්වහන්සේගෙන් මේ ආඥාවලට අද පටන් කීකරුවීමට හැකියාව ඉල්ලන්න.
* මට දේව වචනයෙන් පොරොන්දුවක් ඇත්ද?

ඔබ ක්‍රීඩා කරන ස්ථානයට උන්වහන්සේ කැඳවාගෙන යන්න. ඔබේ ක්‍රීඩා සහ මිතුරන් අතර උන්වහන්සේ ගැවසෙන්න කැමතිදැයි සලකා බලන්න. ඔබේ අල්මාරියේ යතුර උන්වහන්සේට දී එහි ඇති අශෝබන සියල්ල ඉවතලීමට ඉඩ දෙන්න.

ඔබේ නිර්මාණ කාමරයට උන්වහන්සේ කැඳවාගෙන යමින් පසු එහිදී ඔබේ තලෙන්ත යොදා උන්වහන්සේ කියන දෙය තනන්න. ඔබ තුලින් විශිෂ්ඨ ශිල්පියා අලංකාර දේ තනනු ඇත.

මේ සියල්ලම පිවිතුරු කළ පසු ඔබේ නිවසේ යතුර උන්වහන්සේ අතට දෙන්න. උන්වහන්සේගේ නමට ඔබේ ගෙදර ලියා දෙන්න. ඔබේ ගෙදර නම් ඔබේ හදවතයි. ඔබේ හදවත උන්වහන්සේ සතුය.

ඔබ අතින් දැනුදු සිදුවන වැරදි වලට සමාව ඉල්ලන්න. එය නැවත නොකරන්න අධිෂ්ඨාන කරගන්න. ''අපේ පාපවල් කියාදෙමු නම්, අපේ පව් අපට කමාකරන්ටත් සියලු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍රකරන්ටත් උන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටිනසේක.'' 1යොහන් 1:9

ඉතා දැඩි පිපාසාවකින් සමිඳුන්ගේ ශුද්ධාත්මයාණන්ගෙන් ආලේප කරනු ලැබීමට ඉල්ලා සිටින්න. මෙයට ශුද්ධාත්ම බෞතීස්මය යයි කියනු ලැබේ. යේසුස්වහන්සේ, ''ඉල්ලන්න, එවිට ඔබට දෙනු ලැබූ'' යයි අපට පොරොන්දු වූ සේක. පියාණන්වහන්සේද ඔබට ශුද්ධාත්මයාණන් ප්‍රධානය කිරීමට ඉතා ආශාවෙන් බලා සිටින සේක.

ඔබේ අනගි අත්දැකීම අනුන්ටද කියාදී, ඔවුන් සමඟ එය බෙදා ගන්න. ඔවුන්ට ද යේසුස්වහන්සේ හඳුනාගෙන උන්වහන්සේගේ ඇසුරට ගෙනෙන්න සෑම අවස්ථාවක් පාවිච්චි කරන්න.

ඔබේ අරමුණ හා ආශාව විය යුත්තේ යේසුස්වහන්සේ හා සමාන තැනැත්තෙකු වීමට වර්ධනය වීමය.

සමිඳුන්ගේ පවුලේ අනිකුත් සාමාජිකයින් සමග ඇසුරු කරන්න. එක්රැස් වෙන්න. ඒ සමාජය දේව වචනය අදහන සමාජයකි.

පොහොට්ටුවක් අඳුරේ සිට හිරු එළිය දෙස බලන කල එය පිපෙන්නේය. එසේම යක්ෂයා පාලනය කරන අන්ධකාර රාජ්‍යයෙන්, සමිඳුන් පාලනය කරන ආලෝකයේ රාජ්‍යය වෙත යොමු වෙන කල ඔබගේ ජීවිතයේ මල් පෙතිද පිපෙනු ඇත. ඔබ යේසුස් වහන්සේ කෙරෙහි යැපෙමින් උන්වහන්සේගේ වචනයට කීකරු වන තරමට උන්වහන්සේගේ දීප්තිමත් කම ඔබ තුළින් විහිදෙනවා ඇත. මේ අන්ධකාර ලෝකයේ, ඔබේ ජීවිතය, ලෝකයේ ආලෝකය වන යේසුස් වහන්සේගේ ආලෝකයක් වශයෙන් බැබළෙනු ඇත.

ඔබ තව දුරට දැන ගැනීමට කැමති නම් හෝ යේසුස්වහන්සේ ඔබේ ජීවිතයට පුද්ගලිකව ආරාධනය කර පිළිගන්නෙහි නම්, ඔබට අවශ්‍ය උපදෙස් සඳහා අප වෙත ලියා එවන්න. තවත් පාඨමාලාවන් ලැබීමට කැමති නම් ලියන්න.

මේ සියල්ලම ලියා එව්වේ මගේ දක්ෂකමකින් නොවේ. නුමුත් සමිඳුන්ගේ මඟපෙන්වීමෙන් හා පෙළඹවීමෙනි.

මීට,

ක්‍රිස්තුස්වහන්සේ තුළ ආදරණීය මිතුරිය

නිර්මලී බීලිං

තැ.පෙ. 102, කොළඹ.

*මේ ග්‍රන්ථය පිටපත් කිරීමට හෝ පරිවර්ථනය කිරීමට අවසර ඇත. වෙනස් කිරීමට අවසර ගත යුතුය.*

E.mail:nirmalibeling@yahoo.com

*පරිවර්ථනය: ගරු. ලක්ෂ්මන් පීරිස් දේවගැතිතුමා*
*පිටකවරය සැකසීම: ටොම් ටිඩ්බෝල්*

Printed By Big Bird Printers (Pte) Ltd. Tel: 2811657 Fax: 2811878